
කතිරයේ බලය
புள்ளடியின் பலம்
වෙළුම 4 කලාපය 1-2 මැතිවරණ කොමිෂන් සභාව ජනවාරි - අගෝස්තු 2020




# 2020 පාර්ලිමේන්තු මැතිවරණය

චන්න පී. ද සිල්වා
අධ්‍යක්ෂ - පර්යේෂණ හා ක්‍රමසම්පාදන

## හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවේ (2)(ඇ) අනුව්‍යවස්ථාව සමග කියවිය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 10 වන වගන්තියේ විධිවිධාන අනුව, 2020 මාර්තු මස 02 දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසින් ප්‍රසිද්ධ කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තු මැතිවරණය, 2020 අප්‍රේල් මස 25 දින පැවැත්වීම සඳහා, මාර්තු මස 12 දින සිට 19 දින දහවල් 12.00 දක්වා මැතිවරණ කොට්ඨාස 22 හි තේරීම්භාර නිලධාරීන් විසින් නාමයෝජනා භාරගත යුතු විය.

දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ස්ථාපිත මැතිවරණ කොමිෂන් සභාව විසින් පවත්වන ලද ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය වූයේ මෙම මැතිවරණයයි.

මෙයට පෙර කිසිදු අවස්ථාවක අප රට මුහුණ නොදුන් COVID - 19 වසංගත තත්ත්වය හේතුවෙන් මෙම පාර්ලිමේන්තු මැතිවරණය 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24 (3) වගන්තියේ බලතල ප්‍රකාරව අවස්ථාවන් දෙකක දී එනම් අංක 2172/3 දරන 2020.04.20 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ජූනි 20 දිනට ද අංක 2179/17 දරන 2020.06.10 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් 2020 අගෝස්තු මස 05 දිනට ද කල් දැමීමට සිදු විය. වසංගත පාලන සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ ඡන්ද විමසීමේ කටයුතු සංවිධානය කිරීමට සිදුවීම නිසා ඡන්දය දීමට ඡන්ද පොළට පැමිණෙන ඡන්ද දායකයන්ට සහ ඡන්ද පොළ කාර්ය මණ්ඩලයට ද අනුගමනය කිරීමට සිදුවන විශේෂිත ක්‍රියා මාර්ග හේතුවෙන් ඡන්ද දායකයන්ට සිදු විය හැකි ප්‍රමාදය වැළැක්වීම සඳහා ඡන්ද විමසීම් කාලය ද පෙ.ව.7.00 සිට ප.ව. 5.00 දක්වා අමතර පැයක කාලයක් ලබා දුණි.

## 2. මැතිවරණ නීතිය

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා 1980 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත මගින් මෙම පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ නීතිමය විධිවිධාන සලසන ලද අතර, 2015 වර්ෂයේ පාර්ලිමේන්තු මැතිවරණය වනවිට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හතරකින් හා මැතිවරණ නීති සංශෝධන පනත් 05 කින් අදාළ මැතිවරණ නීතිය සංශෝධනය වී තිබුණි.

## 3. ඡන්ද හිමි නාමලේඛනය හා මැතිවරණ කොට්ඨාස අනුව තෝරා ගත යුතු මන්ත්‍රී සංඛ්‍යාව

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 4 වන වගන්තිය අනුව, මැතිවරණයක් පවත්වන ලෙස නියම කරන ලද ප්‍රකාශනය පළ කරනු ලබන දිනයේ ක්‍රියාත්මකව පැවැති ඡන්දහිමි නාමලේඛනය අදාළ මැතිවරණය වෙනුවෙන් වලංගු වන බැවින්, මෙම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන බවට වූ ප්‍රකාශනය පළ වූ දිනය වන විට වලංගුව පැවැති 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය, 2020.01.24 දින සහතික කිරීමෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98 (8) ව්‍යවස්ථාව අනුව, පත්කර ගැනීමට නියමිත මන්ත්‍රීවරු සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2164/9 දරන 2020.02.24 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ ප්‍රකාශය අනුව මැතිවරණ කොට්ඨාස 22 සඳහා මෙම මැතිවරණයේ දී තෝරා පත්කර ගැනීමට නියම වූ මන්ත්‍රීවරු සංඛ්‍යාව පහත දැක්වේ.

| මැතිවරණ කොට්ඨාසයේ නම | තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරු සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 19 |
| ගම්පහ | 18 |
| කළුතර | 10 |
| මහනුවර | 12 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 08 |
| ගාල්ල | 09 |
| මාතර | 07 |
| හම්බන්තොට | 07 |
| යාපනය | 07 |
| වන්නි | 06 |
| මඩකලපුව | 05 |
| දිගාමඩුල්ල | 07 |
| ත්‍රිකුණාමලය | 04 |
| කුරුණෑගල | 15 |
| පුත්තලම | 08 |
| අනුරාධපුරය | 09 |
| පොළොන්නරුව | 05 |
| බදුල්ල | 09 |
| මොණරාගල | 06 |
| රත්නපුර | 11 |
| කෑගල්ල | 09 |
| **එකතුව** | **196** |

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96(4) ව්‍යවස්ථාව අනුව එක් එක් පළාතේ මැතිවරණ කොට්ඨාසවලට ඒ ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් දැක්වෙන ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව අනුසාරයෙන් තෝරා පත් කිරීමට හිමිකම ඇති මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාවට (160) අමතරව මන්ත්‍රීවරුන් සිව් දෙනෙකු බැගින් (9x4=36) පත්කිරීමේ හිමිකම ඇත. ඉහත මන්ත්‍රීවරුන් 196 ට අමතරව තවත් මන්ත්‍රීවරු 29 දෙනෙකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ (ජාතික ලැයිස්තු මන්ත්‍රීවරු) තෝරා පත් කර ගැනේ. ඒ අනුව පාර්ලිමේන්තුවේ මුළු මන්ත්‍රී සංඛ්‍යාව 225 කි.

මෙම පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 2019 වර්ෂයේ වලංගු ඡන්ද නාමලේඛනය අනුව ඡන්ද හිමියන් 16,263,885 දෙනෙකු ලියාපදිංචි වී සිටින ලදී.

## 4. නාමයෝජනා භාරගැනීම

නාමයෝජනා භාරගැනීමට නියමිත වූ 2020 මාර්තු මස 12 දින සිට 19 දින දහවල් 12.00 දක්වා මැතිවරණ කොට්ඨාස 22 වෙනුවෙන්, දේශපාලන පක්ෂ විසින් නාමයෝජනා පත්‍ර 339ක් සහ ස්වාධීන කණ්ඩායම් විසින් නාමයෝජනා පත්‍ර 358 ක් තේරීම්භාර නිලධාරීන් වෙත භාර දී තිබුණි. ඉන් දේශපාලන පක්ෂවලට අදාළ නාමයෝජනා පත්‍ර 304 ක් හා ස්වාධීන කණ්ඩායම් ඉදිරිපත් කළ නාමයෝජනා පත්‍ර 313 ක් පිළිගත් අතර, ඒවායේ ඇතුළත් වූ මුළු අපේක්ෂක සංඛ්‍යාව 7452ක් විය.

නාමයෝජනා භාරගැනීමේ කාලය අවසානයේ දී තරග කරන පිළිගත් දේශපාලන පක්ෂවලට ඒවායේ ලකුණු ද, ස්වාධීන කණ්ඩායම්වල අනුමත ලකුණු ද වෙන් කර, ඉන් අනතුරුව අපේක්ෂකයින් සියලුදෙනාට, නාමයෝජනා පත්‍රවල ඇතුළත් ඔවුන්ගේ නම්, සිංහල භාෂා හෝඩිය අනුව අනුපිළිවෙලට පෙළගස්වා ඔවුන් හඳුනාගැනීම සඳහා අනුපිළිවෙලට අංක වෙන් කිරීම ද සිදු කිරීමෙන් පසු දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා අනුව "ඡන්ද විමසීමේ දැන්වීම" මැතිවරණ කොමිෂන් සභාව විසින් අංක 2179/7 හා 2020.06.09 දිනැති රජයේ ගැසට් නිවේදනයේ පළ කරන ලදී. එම දැන්වීමට අනුව ඡන්ද කොට්ඨාස 12,774 හි මුළු ඡන්ද මධ්‍යස්ථාන 12,985 ක් වූ අතර, එම සංඛ්‍යාවෙන් ඡන්ද පොළවල් 213 ක් ඡන්ද දායිකාවන් සඳහා පමණක් වෙන් විය.

අපේක්ෂකයින් හඳුනාගැනීමේ අංක ඇතුළත් දැන්වීමක් මුද්‍රණය කොට නිල ඡන්ද දැන්වීම්පත් සමග තැපෑලෙන් බෙදාදීමට කටයුතු කළ අතර, එම දැන්වීම්පත් සංඛ්‍යාව දළ වශයෙන් 7,087,400 පමණ විය.

## 5. මැතිවරණ කටයුතු සංවිධානයට බලපෑ කොවිඩ් 19 වසංගත තත්ත්වය

මුළු ලොවම අඩපන කළ කොවිඩ් 19 මාරක වෛරසය ශරීරගත වූ ප්‍රථම ලාංකික රෝගියා හඳුනා ගන්නා ලද්දේ 2020 මාර්තු මස 11 වන දින දීය. මෙදිනට පසුදින සිට 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා නාමයෝජනා බාර ගැනීම් කාල සීමාව ආරම්භ වන බවට වූ නිවේදනය ද නිකුත් කොට තිබුණි. ඉන්පසුව දිවයිනේ විවිධ ප්‍රදේශවලින් කොවිඩ් රෝගීන් හඳුනා ගැනීම නිසා එම රෝගය පැතිරීම වැළැක්වීම උදෙසා රජය විසින් විවිධ පියවර ගන්නා ලදී. විශේෂයෙන්ම මහජනතාව එක්රැස් වීම සීමා කිරීම, එදිනෙදා තම කටයුතුවල නිරත වන පුද්ගලයන් අතර දුරස්ථභාවය පවත්වා ගැනීම සහ නිරන්තර දෑත් පිරිසිදු කිරීමත් රෝග ව්‍යාප්තිය පාලනයට ගත හැකි ක්ෂණික පියවර ලෙස ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් නිවේදනය කරන ලදී. ලංකාවේ ද රජය විසින් අදාළ සියළුම පාර්ශ්ව රැස් කොට කොවිඩ් පාලන කාර්ය සාධන බලකායක් ස්ථාපිත කරන ලද අතර ඒ සඳහා මහජනතාවට අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබා දීම සඳහා ජාතික මෙහෙයුම් මැදිරියක් ද ස්ථාපිත කරනු ලැබීය. ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානය හා ඒ පිළිබඳ විශේෂඥ දැනුමැති සංවිධාන/ නිලධාරීන් විසින් රෝග ව්‍යාප්තිය පාලනය පිණිස අවශ්‍ය මගපෙන්වීම් නිකුත් කොට ඒ සඳහා පුළුල් ප්‍රචාරයක්ද ලබා දීමට පියවර ගෙන තිබුණි.

අනපේක්ෂිතව සිදුවූ මෙම උවදුර පාලනය කිරීම සඳහා රජය විසින් ගන්නා ලද විවිධ පියවර මධ්‍යයේ ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු ආරම්භ කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවිය. නාම යෝජනා බාර ගැනීමේ කාල වකවානුව අතරතුර වූ සාමාන්‍ය දින කිහිපයක් රජය විසින් විශේෂ නිවාඩු දින වශයෙන් ප්‍රකාශයට පත් කිරීම, අත්‍යාවශ්‍ය සේවා සැපයීම් සිදු කෙරෙන කාර්යාල වසා දැමීම, බොහෝ රජයේ කාර්යාල තාවකාලිකව මහජනතාවට විවෘත නොකිරීම, පොදු ප්‍රවාහනය හා ගමනාගමනය සීමා කිරීම වැනි රජය විසින් මුළු දිවයිනටම බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කළ වැඩ පිළිවෙල මධ්‍යයේ ඡන්ද විමසීමේ මූලික කටයුතු සංවිධානය කිරීමට සිදු විය. නාමයෝජනා බාර ගැනීමේ කාලසීමාව තුළ COVID - 19 වසංගත පාලනය සඳහා වූ සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීම රජය විසින් අනිවාර්ය කර තිබීම හේතුවෙන් සහ මැතිවරණ කොමිෂන් සභාව ද නාමයෝජනා බාරදුන් සියලුම පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් වෙතින් කරන ලද ඉල්ලීම අනුව ඔවුන් විසින් නාමයෝජනා කාලසීමාවෙන් අනතුරුව සාම්ප්‍රදායිකව පවත්වනු ලබන කිසිදු මහජන රැස්වීමක්, පා ගමනක් හෝ රථ පෙළපාලියක් නොපවත්වන ලදී.

නාම යෝජනා බාර ගැනීමෙන් පසුව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී කාර්යාලවල හා මැතිවරණ කාර්යාලවල සාමාන්‍ය පරිපාලන කටයුතු ද වසංගත පාලන ක්‍රමවේදවලට අනුව යමින් සීමා කිරීමට සිදුවිය. එසේ වුව ද තේරීම්භාර නිලධාරීන්, දිස්ත්‍රික් නියෝජ්‍ය හා සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් අත්‍යවශ්‍ය මැතිවරණ රාජකාරිවල යෙදුන අතර කාර්යාල නිලධාරීන් ද සීමා සහිත ප්‍රමාණයක් මූලික සංවිධාන රාජකාරි සඳහා කැඳවන ලදී. මෙම කාලය තුළ රජයේ සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද උපරිම අයුරින් අනුගමනය කිරීමට මැතිවරණ කොමිෂන් සභාව පියවර ගන්නා ලද අතර මහජනතාව සඳහා මැතිවරණ කාර්යාල සීමා කරන ලදී. ඡන්ද විමසීමට නැවත දින නියම කිරීමෙන් අනතුරුව දෛනික සාමාන්‍ය කටයුතු සඳහා රට විවෘත කිරීමට රජය විසින් පියවර ගැනීමත් සමග ඡන්ද විමසීමේ මූලික සංවිධාන කටයුතු ද ඒ අනුව කඩිනම් කරන ලදී.

තැපැල් ඡන්ද අයදුම්පත් පරීක්ෂාව, නාමලේඛන සකස් කිරීම, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම, සහතික කිරීමේ නිලධාරීන්

සඳහා උපදෙස් පන්ති පැවැත්වීම හා තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කාර්යයන් ද කොවිඩ් 19 වසංගත පාලන සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව `සිදු කරන ලදී. එයට අමතරව ඡන්ද විමසීමේ මූලික මෙන්ම වැදගත්ම කාර්යයක් වූ නිලධාරීන් පුහුණු කිරීම ඉතා කෙටි කාලයක් තුළ දී අවසන් කිරීමට සිදු වූ අතර ඒ සඳහා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ක්‍රියාත්මක වීම දුෂ්කර හා අභියෝගාත්මක කාර්යයක් විය. පූර්ව ඡන්ද විමසීම්වල දී එක් උපදෙස් සැසියක් සඳහා නිලධාරීන් 100-150 ක් අතර සංඛ්‍යාවක් කැඳවන ලද අතර මෙම ඡන්ද විමසීමේ දී සෞඛ්‍ය උපදෙස් අනුගමනය කිරීමට සිදුවීම හේතු කොට ගෙන එය නිලධාරීන් 50 කට සීමා කිරීමට සිදුවිය. මේ හේතූන් නිසා මෙවර නිලධාරීන් සඳහා උපදෙස් සැසි පැවැත්වීමට වැඩි කාල සීමාවක් වෙන් කිරීමට සිදු විය.

එසේම ඡන්ද පත්‍රිකා ඇතුළු භාණ්ඩ නිකුත් කිරීමේ හා ඒවා ආපසු භාර ගැනීමේ ස්ථාන, ගණන් කිරීමේ මධ්‍යස්ථාන හා ඡන්ද පොළවල් සකස් කිරීම ද කොවිඩ් පාලන සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සිදු කිරීම අත්‍යාවශ්‍යව පැවතිණි. රට තුළ සාමාන්‍ය පරිපාලන කටයුතු ආරම්භ වුව ද වසංගත උවදුර ව්‍යාප්තිය සම්පූර්ණයෙන්ම පහව ගොස් නොතිබිණ. ඡන්ද විමසීමක් වූ කලී විශාල නිලධාරීන් සංඛ්‍යාවකගේ සහයෝගයෙන් සඵල කරගත යුතු අත්‍යන්තයෙන්ම සාමූහික ප්‍රයත්නයක් බැවින් රෝග කාරක වෛරසයේ ව්‍යාප්තිය පාලනය කරනු වස්, ගතහැකි සෑම පූර්වෝපායක්ම යෙදීම මැතිවරණ කොමිෂන් සභාවේ ද ඒ ඒ තේරීම්භාර නිලධාරීන්ගේ ද දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ ද වගකීමක් විය. ඒ අනුව ඡන්ද පොළවල් සඳහා භාණ්ඩ නිකුත් කිරීම් , ඒවා ආපසු භාර ගැනීම් හා ගණන් කිරීමේ ශාලා ද පෙර ඡන්ද විමසීම්වලට වඩා අඩු නිලධාරීන් සංඛ්‍යාවක් මගින් පාලනය කළ හැකි ආකාරයට සංවිධානය කරන ලදී. මේ නිසා අදාළ නිකුත් කිරීම්, භාර ගැනීම් සමග ඡන්ද ගණන් කිරීමේ ශාලා සංඛ්‍යාව වැඩි වූ අතර මැතිවරණ වියදම් ඉහළ යාමට ද එය හේතුවක් විය.

රාජ්‍ය අංශයේ පාලන කටයුතු හා ජන ජීවිතය ද සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් පවතින මොහොතක ඡන්ද විමසීම පවත්වන්නට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවූ අතර රෝග ව්‍යාප්තිය පාලනය පිණිස ඡන්ද විමසීමට අදාළ කාර්යයන්ට භාවිතා කරනු ලබන සෑම ස්ථානයක්ම සම්පූර්ණයෙන්ම විෂබීජහරණය කරන ලදී. එම ස්ථානවලට ඇතුළු වන සියළුම දෙනාගේ උෂ්ණත්වය මැන බැලීම , ඔවුන්ගේ දෑත් සේදීම සහ විෂබීජහරණ ක්‍රියාවලියට නතු කිරීම සිදු විය. ඡන්ද මධ්‍යස්ථාන වෙත පැමිණෙන මහජනතාව හා ඡන්ද පොළ නිලධාරීන් අතර මුහුණුට මුහුණ හමුවීම වැළැක්වීම සඳහා නිලධාරීන් වෙත මුඛ ආවරණ, මුහුණු ආවරණ සහ විෂ බීජ නාශක දියර ලබා දීම හා ඔවුන්ගේ රාජකාරී ස්ථාන පොලිතීන් සහිත කාඩ්බෝඩ් යොදා ආවරණය කිරීමට ද සිදුවිය. ඡන්ද විමසීමේ අනිවාර්ය අවශ්‍යතාවක් වන ඡන්ද දායකයාව උචිත ලකුණෙන් සළකුණු කිරීම සඳහා එක් එක් ඡන්ද දායකයා වෙනුවෙන් වෙන් වෙන් වශයෙන් විශේෂිත ඉටි කූරක් භාවිතා කරන ලදී. ඡන්ද පොළේ ඡන්ද සලකුණු කරන කුටි හා ඡන්දය සලකුණු කිරීමට සපයන ලද කාබන් පෑන් ද, සෑම විනාඩි 15 කට වරක් විෂබීජහරණය කරන ලදී. එසේම ඡන්දය සලකුණු කිරීම සඳහා , තමන්ගේම නිල් හෝ කළු පැහැති බෝල තුඩු පෑනක් රැගෙන ඒමට කටයුතු කරන ලෙස ඡන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටින ලදී. ඡන්ද මධ්‍යස්ථානයට ඇතුළුවීමේ දී, ඡන්ද මධ්‍යස්ථානය තුළ දී සහ ඡන්ද මධ්‍යස්ථානයෙන් පිටවීමේ දී තෙවරක් ඡන්දදායකයන් විෂබීජහරණය සදහා පහසුකම් සලසන ලදී. මේ සියළුම දෑ භාවිතයෙන් පසු ඡන්ද මධ්‍යස්ථානයේ දී ම විනාශ කිරීමට ද ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට හා ග්‍රාම නිලධාරීවරුන්ට උපදෙස් දී තිබුණි.

මෙම ඡන්ද විමසීමේ දී සෞඛ්‍ය මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම, ඒවා නිසි පරිදි අදාළ පාර්ශ්ව විසින් සිදු කරන්නේ ද යන්න අධීක්ෂණය කිරීමේ සම්පූර්ණ වගකීම, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රමුඛ සෞඛ්‍ය අංශ කාර්ය මණ්ඩල වෙත පවරන ලදී. ඒ අනුව සෑම ඡන්ද මධ්‍යස්ථානයකටම සෞඛ්‍ය අංශයේ නිලධාරීන් අනුයුක්ත කළ අතර, කලාප මට්ටමින් එම කටයුතු අධීක්ෂණය සඳහා ද සෞඛ්‍ය අංශ නිලධාරීන් යොදවා තිබුණි. මෙම සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල අධීක්ෂණය යටතේ අදාළ ප්‍රදේශවල නිරෝධායනයට ලක් වූ ඡන්ද හිමියන් සඳහා , ඡන්ද මධ්‍යස්ථානවල වෙනම කුටියක්, ඡන්දය සලකුණු කිරීමට සපයන ලදී.

කොවිඩ් වසංගතය පාලනය පිණිස, මැතිවරණ කොමිෂන් සභාව විසින් ගන්නා ලද ඉහතින් සඳහන් කළ පියවර, සියළු දෙනාගේම පැසසුමට හා ඇගයුමට ලක්ව තිබූ බව අනිවාර්යෙන්ම පැවසිය යුතු ය.

## 6. තැපෑලෙන් ඡන්දය දීම

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(3) වගන්තිය අනුව, නාමයෝජනා දැන්වීම පළවීමෙන් පසුව එළඹෙන 7 වන දින සිට 14 වන දිනය දක්වා තේරීම්භාර නිලධාරීන් තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගත යුතු වේ.

තැපෑලෙන් ඡන්දය දීම සඳහා සුදුසුකම් ලබන පිරිස කවුරුන්දැයි යන්න, පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 26(2) වගන්තියේ දැක්වේ. ඒ අනුව ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්ට, පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරීන්ට, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට, දුම්රිය, තැපැල් හා විදුලි සංදේශ යන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලවලට ලංකා ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, මැතිවරණ රාජකාරී පැවරෙන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන්ට හා පදිංචි දිස්ත්‍රික්කය හැර වෙනත් පරිපාලන දිස්ත්‍රික්කයක් වෙනුවෙන් ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන අපේක්ෂකයින්ට ද, මෙම පහසුකම ලබා ගැනීම සඳහා අයදුම් කළ හැකිය. දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරියා වෙත එවිය යුතු අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා අයදුම්කරුවන්ට තම ලියාපදිංචි විස්තර, ඡන්දහිමි නාමලේඛන පරීක්ෂා කර ලබා ගැනීම අවශ්‍ය වේ. එම කාර්ය පහසු කරවීම් වස් ඡන්දහිමි නාමලේඛන, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද, ග්‍රාම නිලධාරී කොට්ඨාසවල ද අදාළ වන පරිදි ග්‍රාම නිලධාරී කාර්යාලවල ද නාමලේඛන ප්‍රදර්ශනය කරන ලදී. එයට අමතරව රජයේ නිලධාරීන් බහුතරයක් ස්ථානගත වී සිටින කොළඹ දිස්ත්‍රික්කයේ රජයේ කාර්යාල පිහිටි පරිශ්‍රවල ද ඡන්දහිමි නාමලේඛන ප්‍රදර්ශනයට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඒ අනුව රාජ්‍ය පරිපාලන අමාත්‍යංශය, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශය, කම්කරු මහලේකම් කාර්යාලය, අධ්‍යාපන

අමාත්‍යාංශය, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, තැපැල් මූලස්ථානය, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය, සෙත්සිරිපාය පළමු අදියර කාර්යාල සංකීර්ණවල එම ලේඛන ප්‍රදර්ශනය කෙරිණ. ආරක්ෂක අංශවල සාමාජිකයින් හා පොලිස් නිලධාරීන් දිවයින පුරා පිහිටා ඇති සේවා ස්ථානවල සේවය කරනු ලබන බැවින්, ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට අදාළ සේවා ස්ථානවල, තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලුම් කරන්නන්ගේ ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කර ලබා ගැනීමට, සංයුක්ත තැටි වශයෙන් සකසන ලද ඡන්දහිමි නාමලේඛන පිටපත්, මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් එම කාර්ය ස්ථානවලට ලබා ගැනීමට ඉඩ සලසා තිබුණි. ඊට අමතරව මෙම තොරතුරු ලබා දීම සඳහා ම මැතිවරණ මහලේකම් කාර්යාලයේ ස්ථාපිත කර තිබූ විශේෂ දුරකථන මාර්ගවලින් ද 1919 රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය මගින් ද අදාළ අයට ඡන්දහිමි නාමලේඛනයේ තම ලියාපදිංචි විස්තර ලබා ගැනීමට පහසුකම් සලසා තිබුණි. තැපෑලෙන් ඡන්දය දීම සඳහා පහසුකම් අයදුම් කරන්නන් හා පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 122 වගන්තිය යටතේ සිය සේවා ස්ථානවලින් විශේෂ නිවාඩු ලබා ගෙන ඡන්දය පාවිච්චි කිරීම සඳහා යන අය දැනුවත් කිරීමට 2020.07.15 දින භාෂාත්‍රයෙන් ම පුවත්පත් දැන්වීම් පළ කරන ලදී.

මෙම මැතිවරණයේ දී තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2020.03.06 වන දින ආරම්භ කොට, 2020.03.16 වන දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් කිරීමට නියමිතව තිබිණි. එසේ වුව ද කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය පාලනය පිණිස රජය විශේෂ නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම හා ඇඳිරි නීතිය පැනවීම යන හේතූන් නිසා ද, ඡන්ද විමසීම් දිනය අවස්ථා දෙකක දී සංශෝධනය කිරීම නිසා ද තැපැල් ඡන්ද අයදුම්පත්‍ර භාර ගැනීමේ දින වකවානු කල් දැමීමට සිදු විය. ඒ අනුව තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත 2020.05.14 දින ප.ව.4.00 දක්වා ලැබී තිබූ සියලුම අයදුම්පත් භාර ගැනීමට තේරීම්භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන ලද අතර, ඒ සම්බන්ධයෙන් ජනමාධ්‍ය මගින් පුළුල් ප්‍රචාරයක් ද ලබා දීමට ක්‍රියා කරන ලදී. ඡන්ද විමසීම් රාජකාරි සඳහා යෙදවීමට අපේක්ෂිත සියලුම නිලධාරීන්ට ඒ සඳහා අයදුම් කිරීමට ප්‍රමාණවත් කාල සීමාවක් අවශ්‍ය වන හෙයින් තැපැල් ඡන්ද අයදුම් කිරීමේ දින වකවානු සංශෝධනය කිරීම අත්‍යවශ්‍ය කරුණක්ව පැවතිණ.

අනපේක්ෂිතව රට තුළ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වූ කොවිඩ් වසංගතය පාලනය කිරීමේ සම්පූර්ණ වගකීම සෞඛ්‍ය කාර්ය මණ්ඩල වෙත සෘජුව පැවරුණු අතර, ඊට සමගාමීව සියලු රාජ්‍ය හා පෞද්ගලික සේවා සැපයීම් ද විවිධ සීමාවන්ට යටත් කෙරිණ. ඒ වෙනුවෙන් පැය 24 පුරාවට සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින් ස්වකීය දායකත්වය නොඅඩුව ලබාදෙමින් කොවිඩ් වසංගත පාලන කටයුතුවල නියැලුණි. ඡන්දදායකයන්ගේත්, ඡන්ද විමසීම් කාර්ය මණ්ඩලවලත් සෞඛ්‍ය ආරක්ෂාව පවත්වා ගනිමින් වසංගත රෝග පාලන නීති රීති යටතේ ඡන්ද විමසීම පැවැත්වීමට සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල සහාය ලබා ගැනීම අනිවාර්යය අවශ්‍යතාවක්ව පැවතිණ. රට තුළ කොවිඩ් වසංගත පාලනය, මහජන සෞඛ්‍ය නිසි පරිදි පවත්වාගෙන යාම සහ ඡන්ද විමසීම පැවැත්වීමේ කාර්යන් සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවයේ යෙදවීමට සිදු වී ඇති හෙයින් මෙම පාර්ලිමේන්තු මැතිවරණයේ දී සෞඛ්‍ය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ද ප්‍රථම වතාවට තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමේ පහසුකම් ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී. මෙම පහසුකම ලබා දෙන ලෙස දීර්ඝ කාලයක් මුළුල්ලේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කොට තිබූ බව ද සඳහන් කළ යුතුව ඇත. ඒ අනුව සෞඛ්‍ය කාර්ය මණ්ඩලවල තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2020.05.21 වන දින ආරම්භ වූ අතර, එය 2020.06.08 දින මධ්‍යම රාත්‍රී 12.00ට අවසන් විය.

1959 අංක 11 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් තැපැල් ඡන්ද පහසුකම හඳුන්වා දෙන ලද අතර පසුව සිදු කළ සංශෝධන මගින් එම පහසුකම විවිධ කොට්ඨාසවලට පැවරිණි. මෙම මැතිවරණ අවස්ථාව වන විට තැපැල් ඡන්ද පහසුකම ඉල්ලා සිටි පිරිස ලක්ෂ 07 ඉක්මවා තිබිණි. අදාළ තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම කොවිඩ් 19 ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් කිහිප වතාවක් කල්දැමීමට සිදුවූ බැවින්, 2020.06.08 දින දක්වා ම තේරීම්භාර නිලධාරීන් විසින් අයදුම්පත් භාර ගැනීම සිදු කෙරිණි. තැපැල් ඡන්ද පහසුකම් ඉල්ලා සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව 753,476 ක් වූ අතර, පිළිගත් අයදුම්පත් සංඛ්‍යාව 705,505 ක් විය. වැඩිම තැපැල් ඡන්ද දායකයින් පිරිස වූ 76,944ක් ලියාපදිංචිව සිටි මැතිවරණ කොට්ඨාසය වූයේ අංක 15 දරන කුරුණෑගල මැතිවරණ කොට්ඨාසයයි.

පරිගණකගත කර ඇති ඡන්දහිමි නාමලේඛනය අනුව පිළිගත් තැපැල් ඡන්දහිමියන් හඳුනාගෙන ඔවුන්ගේ දත්ත ලබාගෙන, තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන්ගේ නම්, තනතුරු හා ලිපින යටතේ තැපැල් ඡන්ද හිමියන්ගේ නම් ඇතුළත් කර තැපැල් ඡන්ද හිමියන්ගේ නාමලේඛන සකසා එම ලේඛන මුද්‍රණය කොට පිටපත් ලබා ගැනීමටත් කටයුතු කරන ලදී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වූ පරිගණක මෘදුකාංග හා උපදෙස් මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා තාක්ෂණ අංශය මගින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට ලබා දෙන ලදී.

තැපැල් ඡන්ද පත්‍රිකා ඇතුළත් රක්ෂණ කවර අදාළ නිලධාරීන් වෙත කඩිනමින් යැවීම හා සලකුණු කරන ලද කවර නැවත ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධව තැපැල්පතිවරයා ප්‍රමුඛ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පවත්වා විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලදී.

තැපැල් ඡන්දදායකයින්ගේ නම් ලැයිස්තු සහතික කිරීම 2020 ජූනි මස 18 දින සිදු කොට, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා තැපෑලට භාර දීම 2020 ජූනි මස 30, ජූලි මස 01 සහ 02 දිනවල දී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් සිදුකරන ලදී.

තැපැල් ඡන්ද සලකුණු කරනු ලබන සියලුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල/ ආරක්ෂක අංශයේ සේවා ස්ථානවල කොවිඩ් 19 වසංගතය පාලනය පිණිස ක්‍රියාවට නැංවිය යුතු සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිබඳව අධීක්ෂණ කටයුතු 2020 ජූලි 14, 15, 16 හා 17 දිනවල සෘජුවම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල කාර්යය මණ්ඩලයට පැවරූ හෙයින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල පමණක් තැපැල් ඡන්ද සලකුණු කිරීම 2020.07.13 දින ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, පොලීසිය, ආරක්ෂක හමුදා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අංශ හැර සෙසු රාජ්‍ය ආයතනවල තැපැල් ඡන්ද සලකුණු කිරීම 2020.07.14 සහ 15 යන දිනයන්හි දී ද දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, පොලීසිය, ආරක්ෂක හමුදා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අංශවල තැපැල් ඡන්ද සලකුණු කිරීම 2020.07.16 සහ 17 දිනයන්හි දී ද සිදු කිරීමට පහසුකම් සලසන ලදී. මෙම දිනවල තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වූ තැපැල් ඡන්ද හිමියන්ට

2020.07.20, 21, 24 සහ 25 දිනවල තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

මෙම කාලය වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ රාජාංගනය ප්‍රදේශයේ කොවිඩ් 19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වීම හේතුවෙන් එම ප්‍රදේශයේ රජයේ කාර්යාල වසා දැමීමට සිදු වූ බැවින් එම කාර්යාලවල කාර්ය මණ්ඩලයට තැපැල් ඡන්දය සලකුණු කිරීම සඳහා 2020.07.29 දින අවස්ථාව සලසන ලදී. එමෙන්ම ඉහත දිනයන්හි දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට නොහැකි වූ, ඒ ඒ ආයතන ප්‍රධානීන්ගෙන් ලද තොරතුරු හා නිලධාරීන්ගෙන් ලද තොරතුරු අනුව කොවිඩ් වසංගත තත්ත්වය නිසා නිරෝධායනයට ලක් වූ පුද්ගලයන්ගේ හා එම කාලය තුළ රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය පුද්ගලයන්ගේ නම් තැපැල් ඡන්ද නාමලේඛනයෙන් ඉවත් කර එම පුද්ගලයන්ට ඡන්ද විමසීම් දින ස්වකීය ඡන්ද පොළේ දී ඡන්දය ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

## 7. වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීමට අවසර දීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127ආ වන වගන්තිය අනුව තමා ඡන්ද හිමියකු වශයෙන් ලියාපදිංචි ප්‍රදේශයට ගොස් ඡන්දය දීමට, එම ප්‍රදේශවල පවත්නා තත්ත්වය අනුව බියක් දක්වන ඡන්දහිමියන්ට, ඔවුන් දැනට පදිංචිව සිටින ප්‍රදේශවල දී ඡන්දය පාවිච්චි කිරීමට ඉඩ සලසා දිය යුතු ය. මෙම පහසුකම ලබාගැනීම සඳහා සුදුසුකම් ඇති අය, මෙම මැතිවරණයට අදාළ නාමයෝජනා දැන්වීම පළ වූ 2020.03.02 දින සිට සතියක් ඇතුළත අදාළ ඉල්ලුම්පත් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරන ලෙස පුවත්පත් දැන්වීම් හා මාධ්‍ය නිවේදන මගින් දැනුම් දෙන ලදී.

එකී දැන්වීමට ලද ප්‍රතිචාර අනුව තමාට වෙන්කරන ලද ඡන්ද පොළට ගොස් ඡන්දය දීමට නොහැකි තැනැත්තන් සඳහා ඡන්දය ලබාදීමට වෙන් කරන ලද ඡන්ද මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

**මැතිවරණ කොට්ඨාසය 11 - වන්නි**

| ග්‍රාම නිලධාරී වසම | ඡන්ද ප්‍රදේශය | | | ඡන්ද මධ්‍යස්ථානයේ නම | පිළිගත් ඡන්ද හිමියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | මන්නාරම | මුලතිව් | වවුනියා | | |
| 593 - පුලිච්චාකුලම | 169 | - | - | පු/ උමරි පාරූක් මහා විද්‍යාලය - (ශාලා අංක 03), පුලිච්චා කුලම | 227 |
| 593/බී - සාරකුඩිවිල්ලුව | 58 | - | - | | |
| 598/සී - පෙරුක්කුවට්ටවාන් | 13 | | | පු/කල්/රිස්වාන් රජයේ මුස්ලිම් විද්‍යාලය, කරඹ | 857 |
| 603/ඒ - කරඹ | 839 | 3 | 2 | | |
| 606 - මනල්තිව් | 591 | - | - | පු/වේප්පමඩුව මුස්ලිම් මහා විද්‍යාලය | 591 |
| 607/ඩී - පොත්තුවිල්ලුව | 215 | - | - | පු/හදායත්නගර් මුස්ලිම් මහා විද්‍යාලය | 604 |
| 608/බී - විරපුර | 378 | 11 | - | | |
| 617/බී - පුත්තලම නගර නැගෙනහිර | 89 | - | - | පු/ආබිදීන් රජයේ මුස්ලිම් මහා විද්‍යාලය | 328 |
| 617/සී - මරික්කාර් වීදිය | 237 | - | - | | |
| 617/එෆ් - පුදකුඩිරිප්පු | 2 | - | - | | |
| 618/ඒ - තිල්ලයඩිය | 106 | - | - | ආයිෂා පෙරපාසල - අල්කාසිමිසිටි, රත්මල්යාය | 485 |
| 618/බී - රත්මල්යාය | 377 | - | 2 | | |
| 621/ඒ - නොරොච්චෝලේ | 482 | 126 | - | පු/කොඩියාවාඩිය මුස්ලිම් මහා විද්‍යාලය - ශාලා අංක 01 | 608 |
| 622/ඒ - ආලංකුඩා | 410 | 300 | 1 | පු/කොඩියාවාඩිය මුස්ලිම් මහා විද්‍යාලය - ශාලා අංක 02 | 711 |
| 624 - තිගලි | 193 | - | - | පු/කල්/තිගලි මුස්ලිම් මහා විද්‍යාලය, තිගලි | 412 |
| 626 - මුදලෙයිපාලි | 219 | - | - | | |

| ග්‍රාම නිලධාරී වසම | ඡන්ද ප්‍රදේශය | | | ඡන්ද මධ්‍යස්ථානයේ නම | පිළිගත් ඡන්ද හිමියන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | මන්නාරම | මුලතිව් | වවුනියා | | |
| 628 - මුසල්පිටිය | 13 | - | - | පු/කල්/අල් කරම් මුස්ලිම් ප්‍රාථමික විද්‍යාලය | 726 |
| 628/ඒ - පල්ලිවාසතුරෙයි | 502 | - | - | | |
| 629/ඒ - කන්දකුලිය | 122 | - | - | | |
| 629/බී - කුරින්ජම්පිටිය දකුණ | 89 | - | - | | |
| 630/ඒ - පුදකුඩිරිප්පුව | 102 | - | - | පු/අසියුමු රජයේ මුස්ලිම් මහා විද්‍යාලය | 585 |
| 630/බී - වන්නි මුන්දලම | 13 | - | - | | |
| 630/සී - මණ්ඩලකුඩා | 447 | 23 | - | | |
| 635/4 - කරතිව් උතුර | 19 | - | - | පු/වට්ටකන්ඩල් මුස්ලිම් මහා විද්‍යාලය - ශාලා අංක 03, වට්ටකන්ඩල් | 141 |
| 637 - වට්ටකන්ඩල් | 122 | - | - | | |

## 8. අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සැලසීම

2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 40 (2) වගන්තිය අනුව පූර්ණ හෝ අර්ධ දෘෂ්‍යාබාධිත තත්ත්වයකට හෝ යම් ශාරීරික අශක්නුතාවකට පත් ඡන්ද හිමියකුට 2020.08.05 දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී ඡන්ද පොළේ දී ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහායකයකු කැටුව යා හැකි වන පරිදි නීතිමය ප්‍රතිපාදන සලසා ඇති බව දන්වා පුවත්පත් දැන්වීම් හා මාධ්‍ය නිවේදන නිකුත් කරන ලදී.

## 9. කායික දුබලතාවෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 83 (4) (ඈ) වගන්තිය අනුව, යම් කිසි කායික දුබලතාවක් නිසා යම් තැනැත්තෙකුට පයින් හෝ ශ්‍රී ලංකා මධ්‍යම ගමනා ගමන මණ්ඩලය හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවේ දුම්රිය සේවය හෝ යම් වෙනත් මහජන ප්‍රවාහන සේවාවක් විසින් සපයනු ලබන ප්‍රවාහන සේවයක් මගින් ඡන්ද පොළට යාම ඊම කළ නොහැකි නම් ඒ වෙනුවෙන් විකල්ප ප්‍රවාහන පහසුකම් සඳහා තේරීම්භාර නිලධාරීන්ගෙන් අවසර ලබා ගත යුතු ආකාරය පිළිබඳ ඡන්ද දායකයන් දැනුම්වත් කරන ලදී. ඡන්ද පොළට යාම් ඊම් සඳහා ස්වකීය මැතිවරණ කොට්ඨාසයේ තේරීම්භාර නිලධරයා වෙත තමා විසින්ම හෝ එසේ නොමැති නම් තමා වෙනුවෙන්, අපේක්ෂකයකු, ඡන්ද නියෝජිතයකු, බලයලත් නියෝජිතයකු, ප්‍රාදේශීය නියෝජිතයකු නොවන වෙනත් අයකු විසින් හෝ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැකි බවත් මෙම පහසුකම් සඳහා වූ අයදුම් පත්‍ර, 2020 ජූලි 29 වන දින හෝ ඊට පෙර අදාළ තේරීම්භාර නිලධාරී වෙත ලැබෙන ලෙස ඉදිරිපත් කිරීම නීතිමය අවශ්‍යතාවක් වන බවත් පුවත්පත් දැන්වීම් හා මාධ්‍ය නිවේදන මගින් දන්වන ලදී. ඒ පිළිබඳව තේරීම්භාර නිලධාරී සෑහීමට පත් වන්නේ නම්, අදාළ තැනැත්තන්ට විශේෂ ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා අවසරපත් තේරීම්භාර නිලධාරීට නිකුත් කළ හැකි බවත් පුවත්පත් හා මාධ්‍ය නිවේදන මගින් දන්වන ලදී.

## 10. තාවකාලික හැඳුනුම්පත් හා නිල ඡන්ද දැන්වීම්පත්

1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 27 (1) වගන්තිය අනුව, ඡන්ද හිමියන්ගේ නම් ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇති ආකාරය ද ඡන්ද හිමියා සඳහා වෙන් කරනු ලැබ ඇති

ඡන්ද පොළ ද ඡන්ද විමසීමේ දිනය හා වේලාව ද සෑම ඡන්ද දායකයකුම වෙත ඡන්ද විමසීම් දිනට දින 7 කට කලින් ලැබෙන සේ "නිල ඡන්ද දැන්වීම් පතක්" මගින් දැනුම් දිය යුතු වේ. මෙම තොරතුරු දැනුම් දීමේ අවශ්‍යතාව 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) ආඥා පනතට, 1959 අංක 11 දරන සංශෝධන පනතින් මැතිවරණ නීතියට හඳුන්වා දී ඇත. මෙම නිල ඡන්ද දැන්වීම් පත් පරිගණකගත කර ඇති ඡන්ද හිමි නාමලේඛන තොරතුරු ඇසුරින් මුද්‍රණය කරන ලද අතර එම දැන්වීම් පත් තැපැල් කිරීම සඳහා තේරීම්භාර නිලධාරීන්ට භාර දෙන ලදී. මෙම ඡන්ද දැන්වීම් පත් මුද්‍රණය කිරීමේ වත්මන් පිළිවෙත මැතිවරණ ක්‍රියාවලියේ ඉදිරි පියවරක් ලෙස හැඳින්විය හැකිය. 2004 අංක 14 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතින්, ඡන්ද පත්‍රිකාවක් ඡන්දදායකයා විසින් ලබා ගැනීමට පෙර ඡන්ද පොළේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීමේ නීතිමය අවශ්‍යතාව ඇති කරන ලදී. එයට අමතරව වලංගු විදේශ ගමන් බලපත්‍රය, වලංගු රියැදුරු බලපත්‍රය, රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත, වැඩිහිටි හැඳුනුම්පත, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද පූජ්‍ය/ පූජක හැඳුනුම්පත, 2020 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන "ජාතික හැඳුනුම්පතේ තහවුරු කිරීමේ ලිපිය" හා මැතිවරණ කොමිෂන් සභාව මගින් නිකුත් කළ තාවකාලික හැඳුනුම්පත ද මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට ඡන්ද දායකයන්ට අවස්ථාව ලබා දී තිබුණි.

## 11. මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් තරග කරන පාර්ශ්වකරුවන්ට නිදහස් තැපැල් පහසුකම් ලබා දීම.

1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 125 (1) වන වගන්තිය අනුව, මැතිවරණයට තරග කරනු ලබන දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට හා ස්වාධීන කණ්ඩායම්වල නායකයින්ට එම වගන්තිය යටතේ දැක්වෙන ආකාරයට ඔවුන් විසින් පිළියෙල කරන ලද තැපැල් පණිවුඩයක් බැගින් ලියාපදිංචි ඡන්ද හිමියන් වෙත ගාස්තුවකින් තොරව තැපෑලෙන් යැවීම සඳහා අවශ්‍ය පහසුකම් මැතිවරණ කොමිෂන් සභාවේ දැන්වීම පරිදි තැපැල්පතිවරයා විසින් සලසන ලදී.

මෙම පණිවුඩය බාරදිය යුතු තැපැල් කාර්යාල, ඒ ඒ මැතිවරණ කොට්ඨාසය අනුව තෝරා, ඒ අනුව අදාළ පණිවුඩ භාරදිය යුතු කාලය ද තැපැල්පතිවරයා විසින් එම පාර්ශ්ව වෙත දන්වනු ලැබී ය.

## 12. මැතිවරණ ප්‍රචාරක කටයුතු වෙනුවෙන් තරග කරන පාර්ශ්වකරුවන්ට ගුවන් කාල පහසුකම් ලබා දීම.

1981 පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 126(1) වැනි වගන්තිය යටතේ, මෙම පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරග කිරීමට ඉදිරිපත් වූ පිළිගත් දේශපාලන පක්ෂ 40කට හා ස්වාධීන කණ්ඩායම් 313කට, ස්වකීය දේශපාලන ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලිය හා ශ්‍රී ලංකා රූපවාහිනිය මගින් නොමිලේ ගුවන් කාල ලබා දීමට අවකාශ සලසන ලදී. මෙම එක් විකාශන අවස්ථාවක උපරිම කාලය විනාඩි 15 ක් වූ අතර තරග කරනු ලබන මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව 02 සිට 14 දක්වා හෝ අපේක්ෂකයන් සංඛ්‍යාව 132 කට වැඩි වන විට විනාඩි 60 ද මැතිවරණ කොට්ඨාස 14 කට වැඩි සංඛ්‍යාවකට තරග කරනු ලැබූ විට හෝ අපේක්ෂක සංඛ්‍යාව 132 ට වැඩි වන විට එම කාලය උපරිම වශයෙන් විනාඩි 90 කට ද සීමා වේ.

ඒ අනුව ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් සිංහල ස්වදේශීය සේවය මගින් දේශපාලන පක්ෂ 28 වෙනුවෙන් විනාඩි 15 බැගින් වූ වැඩසටහන් 124ක් ද, ස්වාධීන කණ්ඩායම් 201ක් වෙනුවෙන් විනාඩි 15 බැගින් වූ වැඩසටහන් 402ක් ද දෙමළ ස්වදේශී සේවය මගින් දේශපාලන පක්ෂ 12ක් වෙනුවෙන් විනාඩි 15 බැගින් වූ වැඩසටහන් 40ක් ද ස්වාධීන කණ්ඩායම් 112 වෙනුවෙන් විනාඩි 15 බැගින් වූ වැඩසටහන් 224ක් සඳහා ද ගුවන් කාල ලබා දී ඇත. තව ද, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් තරග කරන ලබන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වෙනුවෙන් විනාඩි 15 බැගින් වූ වැඩසටහන් 285ක් සඳහා ගුවන් කාල ලබා දී ඇත.

අපේක්ෂකයන් සඳහා ලබා දෙනු ලබන මෙම ගුවන් කාල පහසුකම් යටතේ, කථා පැවැත්වීමේ දී දේශපාලන පක්ෂවල හා කණ්ඩායම් නායකයින් සමග ද සාකච්ඡා කොට මැතිවරණ කොමිෂන් සභාව විසින් ඒ සඳහා වූ ආචාර ධර්ම පද්ධතියක් පනවා ඒ පිළිබඳව අදාළ ආයතන වෙත මෙන්ම තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් නායකයන් වෙත ද ලිඛිතව දැනුම් දෙන ලදී. මෙම ආචාර ධර්ම පද්ධතියට අනුව කිසිදු පක්ෂයකට/ කණ්ඩායමකට වෙනත් පක්ෂයක් හෝ කණ්ඩායමක් වෙනුවෙන් කථා කිරීම, පක්ෂ/ කණ්ඩායම් ප්‍රතිපත්තිවලට අදාළ කරුණු හැර ප්‍රකෝපකාරී, ද්වේශ සහගත, වෛරී ප්‍රකාශ හෝ යම් පාර්ශ්වයකට අගතියක් වන ආකාරයට කථා පැවැත්වීම නොකළ යුතු විය.

## 13. මැතිවරණයේ දී රාජ්‍ය දේපළ තරග කරන පාර්ශ්වවල ප්‍රවර්ධනයට යොදා ගැනීම වළක්වාලීම හා මැතිවරණ ආරවුල් කළමනාකරණය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනෙන ලද දාහත්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව, රජයේ දේපළ මැතිවරණය සඳහා තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්/ අපේක්ෂකයින් ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි යොදා ගැනීම වළක්වාලීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරී ඇත. ඉහත ව්‍යවස්ථා සංශෝධනවලට පසුව පැවති සෑම මැතිවරණයක දී ම සිදුකළ ආකාරයට, රජයේ දේපළ අවභාවිතා කිරීම වැළැක්වීම සඳහා අංක 2178/29 දරන 2020.06.06 දිනැති රජයේ ගැසට් පත්‍රය මගින් නිවේදනයක් පළ කරන ලදී. ඒ අනුව ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි හෝ යොදා ගැනීම වැළැක්වීම රාජ්‍ය දේපළ භාරකාරත්වය පැවරෙන සියළු දෙනාගේ වගකීමක් වේ.

මෙයට අමතරව, පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ නිල වාහන දේශපාලන ප්‍රචාරක රැස්වීම් සඳහා යෑම් ඊම් පිණිස භාවිතා කිරීම, පළාත් පාලන ආයතන සතු වාහන හා වෙනත් උපකරණ බඩුබාහිරාදිය සහ කාර්ය මණ්ඩලය, පක්ෂ අපේක්ෂක/ ප්‍රවර්ධනය පිණිස හෝ පෝස්ටර් ප්‍රවාහනය කිරීම , රැස්වීම් සංවිධානය කිරීම සඳහා යොදා ගැනීම තහනම් කරන ලදී.මෙම තහනම පිළිබඳව හා දේශපාලන පක්ෂ/ අපේක්ෂක රැස්වීම්, ප්‍රචාරක පෝස්ටර්, පා ගමන්, අත් පත්‍රිකා බෙදීම් යනාදියට අදාළ නීති උල්ලංඝනය කිරීමෙන් වැළකී සිටීමේ අවශ්‍යතාව ද අවධාරණය කරමින් මාධ්‍ය නිවේදන අංක 41 නිකුත් කරන ලදී. මෙය මැතිවරණ නීති අකුරටම ක්‍රියාත්මක කිරීමට මැතිවරණ කොමිෂන් සභාව ගත් පියවරක් ලෙස දැක්විය හැකිය.

මෙම ඡන්ද විමසීමට අදාළව ලැබෙන පැමිණිලි විමර්ශනය සඳහා ජාතික මට්ටමින් හා දිස්ත්‍රික්ක මට්ටමින් පැමිණිලි කළමනාකරණ ඒකක පිහිටුවන ලදී. එම ඒකක සඳහා යෙදවීමට අපේක්ෂා කරන සිවිල් නිලධාරීන් කල්තියා හඳුනාගෙන ඔවුන් සඳහා විශේෂ පුහුණු වැඩසටහන් දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි කලාප මට්ටමින් පවත්වන ලදී. එසේ ම මෙම සෑම පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයකටම ස්ථිර පොලිස් නිලධාරී කණ්ඩායමක් ද අනුයුක්ත කිරීමට පොලිස්පතිවරයා පියවර ගෙන තිබුණු අතර මෙම කාර්යයට සම්බන්ධ කරවීමට අපේක්ෂිත පොලිස් නිලධාරීන් ඇතුළු දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්, සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් වෙනුවෙන් ද පුහුණු වැඩසටහන් පවත්වා ඇත. මැතිවරණ පැමිණිලි විමර්ශන ඒකකවලට දුරකථන, ෆැක්ස්, ඉ තැපෑල, වට්ස්ඇප් මගින් මැතිවරණ පැමිණිලි ඉදිරිපත් කළ හැකි වන පරිදි පහසුකම් සලසා තිබූ අතර, ඒ පිළිබඳව පොදු මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ද පියවර ගෙන තිබුණි. මෙම සමස්ත ක්‍රියාවලිය සම්බන්ධීකරණය හා මෙහෙයවීම මැතිවරණ ආරවුල් කළමනාකරණ ඒකකය මගින් සිදු කරන ලදී. **(මැතිවරණ පැමිණිලි කළමනාකරණ ඒකකවලට ලද පැමිණිලි, සම්බන්ධව ඒවා විමර්ශනය කිරීම සහ ගත් ක්‍රියාමාර්ග පිළිබඳව සම්පූර්ණ තොරතුරු ඇතුළත් ලිපියක් මෙම පුවත් සඟරාවේ ම වෙනත් තැනක පළ වන අතර වැඩිදුර තොරතුරු එම ලිපිය අධ්‍යයනය කිරීමෙන් ලබා ගත හැකි බව කාරුණිකව සැලකුව මැනවි.)**

## 14. ආරක්ෂක කටයුතු සංවිධානය

පාර්ලිමේන්තු මැතිවරණයේ දී ආරක්ෂාව සැලසීම සම්බන්ධව පොලිස්පතිවරයා ප්‍රමුඛ මැතිවරණ කටයුතු භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයා හා ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග සාකච්ඡා කිහිපයක්ම මැතිවරණ කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. මෙම සාකච්ඡාවල දී පැමිණි එකඟතාවන්ට අනුව, තේරීම්භාර නිලධාරීන් හා නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් දිස්ත්‍රික්කවල ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් හා පොලිස් ස්ථානාධිපතිවරුන් සමග සාකච්ඡා පවත්වා, ඡන්ද විමසීම පැවැත්වීම සඳහා අවැසි ආරක්ෂක වැඩපිළිවෙල සංවිධානය කරන ලදී. ඡන්ද විමසීමට අදාළ ආරක්ෂක කටයුතු වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යංශයේ සහාය ද ලබා ගන්නා ලදී. පාර්ලිමේන්තු මැතිවරණයේ මූලික සංවිධාන කටයුතු ආරම්භයේ සිට ඡන්ද විමසීම අවසන් කිරීම දක්වා කාලය තුළ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරී සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් යොදවන ලදී. මෙම ආරක්ෂක වැඩපිළිවෙල හා එයට අදාළ උපදෙස් හා මගපෙන්වීම් ඇතුළත් අත් පොතක් ද පොලිස් දෙපාර්තමේන්තුව විසින් සියළු මට්ටම්වල පොලිස් නිලධාරීන් වෙත නිකුත් කොට තිබුණි. ඡන්ද පොළවල ආරක්ෂාව සඳහා පොලිස් නිලධාරීන් දෙදෙනෙකු බැගින් යොදවා තිබූ අතර, එම ස්ථානවලට ඡන්ද පත්‍රිකා ඇතුළු බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීමේ දී ත්, ඡන්ද විමසීමෙන් පසු ඡන්ද පෙට්ටි සහ අදාළ දෑ ආපසු තේරීම්භාර නිලධාරීන්ගේ උපදෙස් පරිදි ඡන්ද ගණන් කිරීම සඳහා භාර දීමට රැගෙන ඒමේ දී ත්, විශේෂ පොලිස් ආරක්ෂාවක් සලසන ලදී. ඡන්ද විමසීම් දිනයේ දී ඡන්ද විමසීමේ කටයුතු හා එදිනට පෙර දින ඡන්ද පොළවල රැඳී සිටි ඡන්ද පොළ කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සැලසීම සඳහා ද නිරන්තරව ජංගම පොලිස් ඒකක යොදවා තිබුණි.

දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් විසින් ඡන්ද විමසීම් දිනට පෙර දින ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන්ට භාණ්ඩ නිකුත් කිරීම, ඡන්ද විමසීම් දින කටයුතුවලින් පසු ඡන්ද පෙට්ටි ඇතුළු භාණ්ඩ ආපසු භාර ගැනීම, ඡන්ද ගණන් කිරීම හා ප්‍රතිඵල සැකසීම සිදු කරනු ලබන ස්ථානවල ආරක්ෂාව සඳහා, දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් සමග අවශ්‍ය වැඩපිළිවෙල ක්‍රියාවට නංවන ලදී. ඡන්ද ගණන් කිරීමේ කටයුතු ඡන්ද විමසීමට පසු දින සිදු කිරීමට තීරණය කරන ලද හෙයින් ගණන් කිරීමේ ශාලා පිහිටි පරිශ්‍ර සඳහා පොලිස් විශේෂ කාර්ය බලකායේ ආරක්ෂාව ද ලබා දී තිබුණි.

## 15. මාධ්‍ය උපමාන

ඡන්ද විමසීමක් පැවැත්වෙන අවස්ථාවක දී මහජනතාවට ඒ පිළිබඳව බොහෝ තොරතුරු සැපයීම සඳහා විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතා කිරීමට සිදු වේ. මැතිවරණයට තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් ස්වකීය ජයග්‍රහණයෙන් පසුව රටේ සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් හා ව්‍යාපෘති පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීම ද මාධ්‍ය ඔස්සේ සිදු වේ. මෙවැනි තොරතුරු මෙන්ම පක්ෂ/ ස්වාධීන කණ්ඩායමේ ප්‍රචාරක කටයුතු ද සමබරව/ මධ්‍යස්ථව වාර්තා කිරීම ජනමාධ්‍ය තුළින් අපේක්ෂා කෙරෙන අතර එසේ නොවී පක්ෂග්‍රාහීව ක්‍රියා කිරීම තවත් පාර්ශ්වයකට කෙරෙන බලවත් අසාධාරණයක් වේ. රාජ්‍ය මෙන්ම පෞද්ගලික මාධ්‍ය ආයතන ද ඡන්ද විමසීමට අදාළ පුවත් වාර්තාකරණයේ දී මධ්‍යස්ථව ක්‍රියා කිරීම, නිදහස් හා සාධාරණ මැතිවරණ ක්‍රියාවලියක් සඳහා අත්‍යාවශ්‍ය වේ. මෙම තත්ත්වය ද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (5) (අ) අනුව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සියලුම මාධ්‍ය ආයතන ප්‍රධානීන් කැඳවා සාකච්ඡාවක් පවත්වා ඔවුන්ගේ ද එකඟත්වයෙන් සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ ද සහාය ඇතිව මාධ්‍ය උපමාන සකස් කොට 2165/71 හා 2020 මාර්තු මස 06 වන දින අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඉන්පසුව වරින් වර මතු වූ ප්‍රායෝගික ගැටළු සඳහා ද විසඳුම් ලබා දීමේ අරමුණින් යුතුව උක්ත ගැසට් පත්‍රයට කරනු ලැබූ යම් යම් සංශෝධන ඇතුළත් කොට නැවත අංක 2178/24 හා 2020.06.03 දිනෙන් යුතුව හා අංක 2184/51 හා 2020.07.17 දිනැති සංශෝධිත අති විශෙෂ ගැසට් පත්‍ර ද නිකුත් කරන ලදී.

## 16. මැතිවරණ රාජකාරී සඳහා නිලධාරීන් හා වාහන යෙදවීම

මෙම ඡන්ද විමසීම සාර්ථක ලෙස කළමනාකරණය කිරීම සඳහා රාජ්‍ය නිලධාරීන්, පොලිස් දෙපාර්තමේන්තුව ඇතුළු ආරක්ෂක අංශවල නිලධාරීන් හා රාජ්‍ය ආයතන සතු සම්පත්, වාහන ආදිය යොදා ගන්නා ලදී. ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා භාර ගැනීම, ඡන්ද පොළ, ඡන්ද ගණන් කිරීම, ප්‍රතිඵල වගුගත කිරීම, සම්බන්ධීකරණ කාර්ය මණ්ඩල, කමිටු රාජකාරි, අනියම් ආදී රජයේ ජ්‍යෙෂ්ඨතම නිලධාරීන්ගේ සිට කණිෂ්ඨ සේවක මට්ටම දක්වා වූ විවිධ කණ්ඩායම්වල සහාය ලබා ගැනීමට සිදු විය. මෙම ඡන්ද විමසීම සඳහා දළ වශයෙන් රාජ්‍ය සේවකයන් හා අනියම් කාර්ය මණ්ඩල සේවකයන් 263,500ක් පමණ යොදා ගැනීමට සිදු විය. මෙම නිලධාරීන් තෝරා ගැනීමට අදාළ නිලධාරී සංගණන කටයුතු, පුහුණු කිරීම හා අනුයුක්ත කිරීම කොළඹ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල මට්ටමින් සිදු කරන ලදී. එසේ ම ඡන්ද පෙට්ටි ඇතුළු බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම, කලාප අධීක්ෂණ හා මූලික සංවිධාන කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතු වාහන දළ වශයෙන් 5,700ක් පමණ ඡන්ද විමසීමේ රාජකාරී සඳහා යොදා ගන්නා ලදී. මෙයට අමතරව ශ්‍රී ලංගම බස්රථ, පෞද්ගලික බස්රථ හා කුලීරථ ද, පමණක් නොව නාවික හමුදා බෝට්ටු හා ගුවන් හමුදාවේ යානා ද ඡන්ද පෙට්ටි ප්‍රවාහනය සඳහා යොදා ගෙන තිබුණි.

## 17. මැතිවරණ මූල්‍ය කළමනාකරණය

සෑම ඡන්ද විමසීමක් ආරම්භයේ දීම ඒ සඳහා වූ දළ වියදම් ඇස්තමේන්තු සකස් කොට මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කෙරේ. මෙම පාර්ලිමේන්තු ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් අධික වීම නිසා මැතිවරණ කොමිෂන් සභාව සතු කුඩා ප්‍රමාණයේ ලී ඡන්ද පෙට්ටි 569 ක් ද පසුගිය ජනාධිපතිවරණයේ දී හඳුන්වා දුන් කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි, කුඩා, මධ්‍යම හා විශාල ප්‍රමාණවලින් 12,551 ක් ද යොදා ගන්නා ලදී. කොවිඩ් 19 වසංගතය පාලනය සඳහා වූ සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුගමනය කිරීමට සිදු වීම හේතු කොට ගෙන සියලුම ඡන්ද මධ්‍යස්ථාන සඳහා විශේෂිත කාඩ්බෝඩ් කුටි, අත් සේදුම් කාරක දියර ලබා දීමට ද සිදු විය. දේශපාලන පක්ෂ/කණ්ඩායම්වල ප්‍රතිපත්ති ප්‍රකාශ නිදහස් තැපෑලෙන් යැවීම , නිල ඡන්ද දැන්වීම් පත්, ගෘහ දැන්වීම් හා පත්වීම් ලිපි ආදිය බෙදා හැරීම සඳහා ප්‍රමුඛ සේවා ලේබලය යටතේ තැපැල් දෙපාර්තමේන්තුව පහසුකම් සලසා දෙන ලදී. ඡන්ද පත්‍රිකා ඇතුළු ව්‍යවස්ථාපිත ලිපි ලේඛන බොහොමයක් මුද්‍රණය කරන ලද්දේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසිනි. එයට අමතරව අත්‍යවශ්‍ය වූ ව්‍යවස්ථාපිත නොවන උපලේඛන පෞද්ගලික ආයතනවලින් මුද්‍රණය කරවා ගන්නා ලදී. ඡන්දය ප්‍රකාශ කිරීමේ දී ඡන්ද දායකයන් විසින් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කිරීම අනිවාර්ය අවශ්‍යතාවකි. ජාතික හැඳුනුම්පත් අයදුම් කොට එහෙත් 2020.07.08 දින දක්වා ඒවා නොලැබුණු අයදුම්කරුවන් සඳහා ජාතික හැඳුනුම්පතේ තොරතුරු ඇතුළත් විශේෂ කඩදාසියක මුද්‍රණය කරන ලද පත්‍රිකාවක් පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් කඩිනමින් මුද්‍රණය කර ගැනීමට සිදු විය. ඡන්ද විමසීම් පනතේ විධි විධාන අනුව අපේක්ෂකයන්ට ප්‍රචාරක කටයුතු සඳහා නොමිලේ ගුවන් කාල ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව හා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව යන ආයතනවලට දරන්නට සිදු වූ වියදම ප්‍රතිපූරණය කර දෙන ලෙස එම ආයතන වෙතින් ඉල්ලීම් ලැබී තිබේ. එසේම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ද මෙම මැතිවරණයේ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීමේ හා ප්‍රතිඵල නිකුත් කිරීමට අදාළ කටයුතු සඳහා සහාය දක්වන ලදී. ඉහත ආයතනවලින් ලබා ගන්නා ලද සේවාවන්ට/ කාර්යයන්ට ගෙවීම් කිරීමට අමතරව මැතිවරණ කොමිෂන් සභාවට දැරීමට සිදු වූ සියළුම වියදම් ද ඇතුළත්ව මෙම මැතිවරණයේ කාර්යයන් සඳහා දළ වශයෙන් රුපියල් මිලියන 6,500 ක් පමණ වැය වෙතැයි අපේක්ෂා කෙරේ.

## 18. මැතිවරණය පැවැත්වීම

2020.08.05 දින පෙ.ව.7.00 සිට ප.ව. 5.00 දක්වා කාලය තුළ දිවයිනේ මැතිවරණ කොට්ඨාස 22 හි, ඡන්ද මධ්‍යස්ථාන 12,985ක ද අවතැන් ඡන්ද හිමියන් සඳහා පිහිටුවන ලද ඡන්ද මධ්‍යස්ථාන 12ක ද ඡන්ද විමසීම් කටයුතු පැවැත්වීමට අවශ්‍ය සියලු සංවිධාන කටයුතු ඊට පෙර දින තේරීම්භාර නිලධාරීන් විසින් අවසන් කරන ලදී. ඡන්ද පොළවල් බාරව ක්‍රියාකරන ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරු ඇතුළු සෙසු කාර්ය මණ්ඩලය ද ඡන්ද පොළවල්වලට අවශ්‍ය බඩුබාහිරාදිය ද ඡන්ද විමසීම් දිනට පෙර දින, ඡන්ද පොළවල් කරා ප්‍රවාහනය කරන ලදී. ඡන්ද පොළවල් සඳහා භාණ්ඩ නිකුත් කිරීම්, ආපසු භාර ගැනීම් ආදිය සිදු කිරීමේ ස්ථාන, ගණන් කිරීමේ ශාලා සහ ඡන්ද පොළවල් සඳහා රජය සතු ගොඩනැගිලි, පාසල් හා ආගමික ස්ථාන සතු ගොඩනැගිලි භාවිතා කරන ලදී. එයට අමතරව අවස්ථානුකූලව ඡන්ද මධ්‍යස්ථාන සඳහා තාවකාලික මඩු ඉදිකරන ලදී. මෙම මැතිවරණයේ දී ඡන්ද නිරීක්ෂණ කටයුතු සඳහා දේශීය නිරීක්ෂණ සංවිධාන පමණක් සම්බන්ධ වූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය මත විදේශීය නිරීක්ෂකයින් සහභාගී නොවුණි. පැෆරල් සංවිධානය හා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)ඡන්ද පොළ තුළ සිට නිරීක්ෂණ කටයුතු කළ අතර සෙසු සංවිධාන බාහිර නිරීක්ෂණ කටයුතු පමණක් සිදු කරන ලදී. සමානුපාතික මැතිවරණ ක්‍රමය යටතේ ඡන්ද විමසීම් දිනම ඡන්ද ගණන් කිරීම සිදු වුව ද මෙවර ප්‍රථම වතාවට ඡන්ද විමසීම් දිනට පසුදින එනම් 2020.08.06 දින පෙ.ව 8.00 සිට මැතිවරණ කොට්ඨාස 22 තුළ පිහිටුවන ලද ඡන්ද ගණන් කිරීමේ පරිශ්‍ර 71ක සාමන්‍ය ගණන් කිරීමේ ශාලා 2306ක සහ තැපැල් ඡන්ද ගණන් කිරීමේ ශාලා 453ක දී මැතිවරණයට තරග කළ පාර්ශ්වවල නියෝජිතයන් ඉදිරියේ ඡන්ද ගණන් කිරීම සිදුකරන ලදී. මෙම ඡන්ද විමසීමේ දී ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව 16,263,885ක් වූ අතර එයින් 12,343,302 එනම් 75.89% ඡන්දය භාවිත කරන ලදී.


**පරිශීලනය කරන ලද ලේඛන**

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
2. 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත
3. මැතිවරණ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබූ ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මැතිවරණ (1947 සිට 2015 දක්වා) ග්‍රන්ථය
4. 2020 පාර්ලිමේන්තු මැතිවරණය සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නඩත්තු කරන ලද ලිපිගොනු


## ඡන්දහිමි නාමලේඛනය ප්‍රතිශෝධනය 2020

ඡන්දහිමියන් ගණන් ගන්නා ආකෘතිය (BC ආකෘතිය)
සියළුම ග්‍රාම නිලධාරී විසින් හා විශේෂ ගණන් ගන්නා නිලධාරීන් විසින් ගෘහ මූලිකයන් වෙත බෙදාහැරීම ආරම්භකර ඇත.

| | | |
|---|---|---|
| BC ආකෘතිය ගෘහ මූලිකයන්ගෙන් ආපසු භාර ගැනීම | | 2020.11.16 දක්වා |
| ලියාපදිංචි නොවූ අයගෙන් පැමිණිලි UE ආකෘති E-Mail මගින් භාරගැනීම | | 2020.10.12 සිට 2020.11.23 |
| "අ" සහ "ආ" ලැයිස්තු | සකස් කිරීම හා පරීක්ෂා කිරීම | 2020.11.27 දක්වා |
| | ප්‍රදර්ශන ස්ථාන වෙත යවා තිබීම | 2020.11.30 |
| ඡන්දමිහි නාමලේඛනයේ ඉවත් වන හා ඇතුළත් වන නම් ("අ" සහ "ආ" ) ලැයිස්තුව ප්‍රදර්ශනය | | 2020.12.03 සිට 2020.12.30 |
| හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කිරීම<br>14(6) වගන්තිය අනුව විරෝධතා ඉදිරිපත් කිරීම<br><br>14(3) වගන්තිය යටතේ හිමිකම් ලැයිස්තු ප්‍රදර්ශනය<br>I. වන හිමිකම් ලැයිස්තුව<br>II. වන හිමිකම් ලැයිස්තුව<br><br>14(7) වගන්තිය අනුව හිමිකම් සඳහා විරෝධතා ඉදිරිපත් කිරීම<br>I. වන හිමිකම් ලැයිස්තුව සඳහා<br>II. වන හිමිකම් ලැයිස්තුව සඳහා | | 2020.11.19 සිට 2020.12.16<br>2020.11.19 සිට 2020.12.16<br><br><br>2020.12.03<br>2020.12.17<br><br><br>2020.12.03 සිට 2020.12.16<br>2020.12.17 සිට 2020.12.30 |
| හිමිකම් විරෝධතා පරීක්ෂණ | | 2020.12.03 සිට 2021.02.15 |
| කෙටුම්පත් නාමලේඛනය ග්‍රාම නිධාරී කාර්යාල සහ මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය | | 2021.03.04 සිට 2021.03.10 |
| ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම | | 2021.03.15 |

# පාර්ලිමේන්තු මැතිවරණය - 2020

## එක් එක් දේශපාලන පක්ෂ, ලබාගත් ජන්ද සංඛ්‍යාව හා හිමිකරගත් මන්ත්‍රීධුර සංඛ්‍යාව

| පක්ෂය/ ස්වාධීන කණ්ඩායම | ලබාගත් ඡන්ද සංඛ්‍යාව හා ප්‍රතිශතය | | මැතිවරණ කොට්ඨාස යටතේ හිමිකරගත් ආසන සංඛ්‍යාව | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99 අ ව්‍යවස්ථාව යටතේ හිමිවන ආසන සංඛ්‍යාව | ආසන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ | 6,853,690 | 59.09% | 128 | 17 | 145 |
| සමගි ජන බලවේගය | 2,771,980 | 23.90% | 47 | 7 | 54 |
| ඉලංකෙයි තමිල් අරසු කච්චි | 327,168 | 2.82% | 9 | 1 | 10 |
| ජාතික ජන බලවේගය | 445,958 | 3.84% | 2 | 1 | 3 |
| අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රසය | 67,766 | 0.58% | 1 | 1 | 2 |
| ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය | 61,464 | 0.53% | 2 | - | 2 |
| එක්සත් ජාතික පක්ෂය | 249,435 | 2.15% | 0 | 1 | 1 |
| අපේ ජන බලවේගය පක්ෂය | 67,758 | 0.58% | 0 | 1 | 1 |
| තමිල් මක්කල් විදුතලෙයි පුලිකල් | 67,692 | 0.58% | 1 | 0 | 1 |
| ශ්‍රී ලංකා නිදහස් පක්ෂය | 66,579 | 0.57% | 1 | 0 | 1 |
| මුස්ලිම් ජාතික පෙරමුණ | 55, 981 | 0.48% | 1 | 0 | 1 |
| තමිල් මක්කල් තේසායි කූට්ටනි | 51,301 | 0.44% | 1 | 0 | 1 |
| ඕල්සිලෝන් මක්කල් කොංග්‍රසය | 43,319 | 0.37% | 1 | 0 | 1 |
| ජාතික කොංග්‍රසය | 39,272 | 0.34% | 1 | 0 | 1 |
| ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය | 34,428 | 0.30% | 1 | 0 | 1 |
| **එකතුව** | **11,598,929** | **71.32%** | **196** | **29** | **225** |

| ලියාපදිංචි ඡන්ද හිමියන් ගණන | වලංගු ඡන්ද සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව |
|---|---|---|---|
| 16,263,885 | 11,598,929 (71.32%) | 744,373 (4.58%) | 12,343,302 (75.89%) |

# පාර්ලිමේන්තු මැතිවරණය - 2020

## දිස්ත්‍රික් මනාප ප්‍රතිඵල

### 01 කොළඹ

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| සරත් වීරසේකර | 3,28,092 |
| විමල් වීරවංශ | 2,67,084 |
| උදය ප්‍රභාත් ගම්මන්පිල | 1,36,331 |
| විජයදාස රාජපක්ෂ | 1,20,626 |
| බන්දුල ගුණවර්ධන | 1,01,644 |
| ප්‍රදීප් සමන් කුමාර උඳුගොඩ රූපසිංහගේ | 91,958 |
| දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන | 85,287 |
| මධුර විතානගේ | 70,205 |
| ප්‍රේම්නාත් සී. දොලවත්ත | 69,055 |
| ගාමිණී කුලවංශ ලොකුගේ | 62,543 |
| අච්චිගේ දොන් සුසිල් ප්‍රේමජයන්ත් | 50,322 |
| ජගත් කුමාර | 47,693 |
| **සමගි ජන බලවේගය** | |
| සජිත් ප්‍රේමදාස | 3,05,744 |
| එස්.එම්. මරික්කාර් | 96,916 |
| මොහොමඩ් මුජිබර් රහුමාන් | 87,589 |
| හිනිගේ මහේන්ද්‍ර හර්ෂ ද සිල්වා | 82,845 |
| අච්චිගේ පාඨලී චම්පික රණවක | 65,574 |
| ඇම්. ගනේෂන් | 62,091 |
| **ජාතික ජන බලවේගය** | |
| අනුර කුමාර දිසානායක | 49,814 |

### 02 ගම්පහ

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| නාලක ගොඩහේවා | 3,25,479 |
| ප්‍රසන්න රණතුංග | 3,16,544 |
| හේරත් හිටිහාමි අප්පුහාමිලාගේ දොන් ඉන්දික අනුරුද්ධ | 1,36,297 |
| ආරච්චිලාගේ සිසිර ජයකොඩි | 1,13,130 |
| ඇන්ටනි නිමල් ලාන්සා | 1,08,945 |
| එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන | 97,494 |
| පර්පචුවා සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ | 89,329 |
| ප්‍රසන්න රණවීර බුලත්වැලගේ | 83,203 |
| කෝකිලා හර්ෂණී ගුණවර්ධන | 77,922 |
| අ. අලහියවන්න ලසන්ත | 73,061 |
| කච්චකඩුගේ නලින් රුවන්ජීව ප්‍රනාන්දු | 69,800 |
| විතාන පතිරණගේ මිලාන් සජිත් ජයතිලක | 68,449 |
| රාජපක්ෂ පතිරන්නැහැලාගේ උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ | 67,756 |
| **සමගි ජන බලවේගය** | |
| සරත් ෆොන්සේකා | 1,10,535 |
| අ.අ. රන්ජන් ලියෝ සිල්වෙස්ටර් රාමනායක | 1,03,992 |
| හර්ෂණ සුපුන් රාජකරුණා | 73,612 |
| සේනාධීරගේ දොන් කවින්ද හේෂාන් ජයවර්ධන | 52,026 |
| **ජාතික ජන බලවේගය** | |
| හේරත් මුදියන්සේලාගේ විජිත හේරත් | 37,008 |

### 03 කළුතර

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| විදුර වික්‍රමනායක | 1,47,958 |
| අබේගුණවර්ධන රෝහිත පියතිස්ස පහලගේ | 1,47,472 |
| ආරච්චිගේ සංජීව එදිරිමාන්න | 1,05,973 |
| ඇච්.ඇම්. පියල් නිශාන්ත ද සිල්වා | 1,03,904 |
| ඇස්.ඒ. ජයන්ත | 1,00,386 |
| අනූප පියුම් පස්කුවල් | 97,777 |
| ලලිත් එල්ලාවල | 76,705 |
| මහින්ද බුද්ධදාස සමරසිංහ | 58,514 |
| **සමගි ජන බලවේගය** | |
| රාජිත සේනාරත්න | 77,476 |
| කුමාර වෙල්ගම | 77,083 |

### 04 මහනුවර

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| අමුණුගම දිලුම් සුරාජ් බණ්ඩාර | 1,71,758 |
| අලුත්ගමගේ මහින්දානන්ද | 1,61,471 |
| ලොහාන් රත්වත්ත | 1,40.917 |
| අනුරාධ ජයරත්න | 1,40,798 |
| කෙහෙලිය රඹුක්වැල්ල | 1,10,832 |
| වසන්ත යාපා බණ්ඩාර | 1,08,940 |
| ගුණතිලක රාජපක්ෂ | 49,317 |
| උදයන චාමින්ද කිරිඳිගොඩ | 39.904 |
| **සමගි ජන බලවේගය** | |
| අබ්දුල් රවුෆ් හිබතුල් හකීම් | 83,398 |
| අබ්දුල් හලීම් මොහොමඩ් හාසීම් | 71,063 |
| වේලු කුමාර් | 57,445 |
| ලක්ෂ්මන් බණ්ඩාර කිරිඇල්ල | 52,311 |

### 05 මාතලේ

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| තෙන්නකෝන් ජනක බණ්ඩාර | 73,296 |
| ඇන්. නාලක බණ්ඩාර කෝට්ටේගොඩ | 71,404 |
| තෙන්නකෝන් ප්‍රමිත බණ්ඩාර | 67,776 |
| රෝහණ දිසානායක | 50,368 |
| **සමගි ජන බලවේගය** | |
| ජම්බුගහ පිටියේගෙදර රෝහිණී කුමාරි විජේරත්න කවිරත්න | 27,587 |

### 06 නුවරඑළිය

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| ජීවන් තොන්ඩමන් | 1,09,155 |
| ආර්.එම්.සී.බී.රත්නායක | 70,871 |
| ඇස්.බී. දිසානායක | 66,045 |
| මරුදපාන්ඩි රාමේෂ්වරන් | 57,902 |
| නිමල් පියතිස්ස | 51,225 |
| **සමගි ජන බලවේගය** | |
| වී.පලනි | 83,392 |
| වේලුසාමි රාධාක්‍රිෂ්ණන් | 72,167 |
| මයිල්වාගනම් උදයකුමාර් | 68,119 |

### 07 ගාල්ල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| රමේෂ් පතිරණ | 2,05,814 |
| අතුකෝරළගේ කාරියවසම් චමින්ද සම්පත් | 1,28,331 |
| අගම්පොඩි මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා | 1,11,626 |
| චන්දිම වීරක්කොඩි | 84,984 |
| ඉසුරු දොඩන්ගොඩ | 71,266 |
| ෂාන් විජයලාල් ද සිල්වා | 67,793 |
| ගීතා සමන්මලී කුමාරසිංහ | 63,357 |
| **සමගි ජන බලවේගය** | |
| ගයන්ත කරුණාතිලක | 50,097 |
| මලිගස්පේ කෝරලේගේ නලින් මනූෂ නානායක්කාර | 47,399 |

### 08 මාතර

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| නිපුණ රණවක | 1,31,010 |
| කරුණාදාස කොඩිතුවක්කු | 1,14,319 |
| අලහප්පෙරුම ඩලස් | 1,03,534 |
| කංචන විජේසේකර | 96,033 |
| අබේවර්ධන යාපා මහින්ද | 80,595 |
| ගමගේ හත්තොටුව වීරසුමන වීරසිංහ | 77,967 |
| **සමගි ජන බලවේගය** | |
| අකලංක බුද්ධික උදිත දෙද්දුව පතිරණ | 44,839 |

## 09 හම්බන්තොට

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| නාමල් රාජපක්ෂ | 1,66,660 |
| දෙනගම විතාරණගේ චානක දිනුෂාන් | 1,28,805 |
| අමරවීර මහින්ද | 1,23,730 |
| චමල් රාජපක්ෂ | 85,330 |
| උපුල් සංජීව ගලප්පත්ති | 63,369 |
| අජිත් රාජපක්ෂ | 47,375 |
| **සමගි ජන බලවේගය** | |
| දිලිප් වෙදආරච්චි | 25,376 |

## 10 යාපනය

| | |
|---|---|
| **ඉලංකෙයි තමිල් අරසු කච්චි** | |
| සිවඥානම් සිරිතරන් | 35,884 |
| ආබ්‍රහාම් සුමන්තිරන් මදියාපරණන් | 27,834 |
| තරුමලිංගම් සිත්තාර්ත්තන් | 23,840 |
| **ශ්‍රී ලංකා නිදහස් පක්ෂය** | |
| අන්ගජන් ඉරාමනාතන් | 36,365 |
| **ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය** | |
| ඩග්ලස් දේවානන්දා | 32,146 |
| **අකිල ඉලංගෙයි තමිල් කොංග්‍රසය** | |
| ගජේන්තිරකුමාර් ගාංගේසර් පොන්නම්බලම් | 31,658 |
| **තමිල් මක්කල් තේසිය කුට්ටනි** | |
| කනකසබාපති විශ්වලිංගම් විග්නේෂ්වරන් | 21,554 |

## 11 වන්නි

| | |
|---|---|
| **ඉලංකෙයි තමිල් අරසු කච්චි** | |
| ඉරුදයනාදන් චාල්ස් නිර්මලනාදන් | 25,668 |
| අ. අඩයික්කලනාදන් | 18,563 |
| සු. නෝගරාදලිංගම් | 15,190 |
| **සමගි ජන බලවේගය** | |
| අබ්දුල් රිසාක් බදියුදීන් | 28,203 |
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| කාදර් කාදර් මස්තාන් | 13,454 |
| **ඊලාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය** | |
| කුලසිංහම් තිලීපන් | 3,203 |

## 12 මඩකලපුව

| | |
|---|---|
| **ඉලංකෙයි තමිල් අරසු කච්චි** | |
| ඉරාසමාණික්කම් සාණක්කියා රාහුල් රාජපුත්තිරන් | 33,332 |
| කෝවින්තන් කරුණාකරම් | 26,382 |
| **තමිල් මක්කල් විඩුදලෙප්පුලිකල්** | |
| සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් | 54,198 |
| **ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය** | |
| අහමඩ් සෙයිනුලාබිදීන් නසීර් | 17,599 |
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| සදාසිවම් වියාලේන්ද්‍රන් | 22,218 |

## 13 දිගාමඩුල්ල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| දිසානායක විමලවීර | 63,594 |
| ඩී. වීරසිංහ | 56,006 |
| රාජ් මන්ත්‍රීලාගේ තිලක් රාජපක්ෂ | 54,203 |
| **සමගි ජන බලවේගය** | |
| හබීබ් මොහමඩ් මොහමඩ් හරීස් | 36,850 |
| මොහමඩ් කාසීම් මොහමඩ් ෆයිසාල් | 29,423 |
| **ජාතික කොංග්‍රසය** | |
| අතාඋල්ලා අහමඩ් ලෙබ්බෙ මරික්කාර් | 35,697 |
| **අකිල ඉලංගෙයි මහජන කොංග්‍රසය** | |
| සහියුල් මුතුනාබීන් මොහමඩ් මුෂාරෆ් | 18,389 |

## 14 ත්‍රිකුණාමලය

| | |
|---|---|
| **සමගි ජන බලවේගය** | |
| මුහම්මදු ෂරීෆ් තවුෆීක් | 43,759 |
| ඉම්රාන් මහරූෆ් | 39,029 |
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| අතුකෝරාලලාගේ පැලවත්තේ කපිල නුවන් අතුකෝරල | 30,056 |
| **ඉලංකෙයි තමිල් අරසු කච්චි** | |
| ඉරාජවරෝදයම් සම්බන්ධන් | 21,422 |

## 15 කුරුණෑගල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| මහින්ද රාජපක්ෂ | 5,27,364 |
| ජොන්ස්ටන් ප්‍රනාන්දු | 1,99,203 |
| බස්නායක යසරත්නලාගේ ගුණපාල රත්නසේකර | 1,41,991 |
| දයාසිරි ජයසේකර | 1,12,452 |
| අසංක සම්පජීව නවරත්න | 82,779 |
| එච්.එම්. සමන්ප්‍රිය හේරත් | 66,814 |
| ඩී.බී. හේරත් | 61,954 |
| අනුර ප්‍රියදර්ශන යාපා | 59,696 |
| ජයරත්න හේරත් | 54,351 |
| ශාන්ත බණ්ඩාර | 52,086 |
| උඩුකුඹුරගේ සුමිත් | 51,134 |
| **සමගි ජන බලවේගය** | |
| නලින් බණ්ඩාර ජයමහ | 75,631 |
| අලවතුවල ජේ.සී. | 65,956 |
| අශෝක අබේසිංහ | 54,512 |
| අමරසේන තුෂාර ඉඳුනිල් | 49,348 |

## 16 පුත්තලම

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| සනත් නිශාන්ත | 80,082 |
| පියංකර ජයරත්න | 75,425 |
| අරුන්දික ප්‍රනාන්දු | 70,892 |
| චින්තක අමල් මායාදුන්න | 46,058 |
| අශෝක ප්‍රියන්ත | 41,612 |
| **සමගි ජන බලවේගය** | |
| අප්පුහාමි මාකවිට ආරච්චිගේ දොන් හෙක්ටර් හයිජිනස් | 34,127 |
| නානායක්කාර වර්ණකුල පටබැඳිගේ නිරෝෂන් අර්ඩ්ලි ප්‍රියන්ත පෙරේරා | 31,636 |
| **මුස්ලිම් ජාතික සන්ධානය** | |
| අබ්දුල් අලි සබ්රි මොහමඩ් රහීම් | 33,509 |

## 17 අනුරාධපුරය

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| එස්.එම්. චන්ද්‍රසේන | 1,39,368 |
| වන්න සුදත් ජයසුමන | 1,33,980 |
| උද්දික ප්‍රේමරත්න | 1,33,550 |
| අසංක ශෙහාන් සේමසිංහ | 1,19,878 |
| දුමින්ද දිසානායක | 75,535 |
| එච්. නන්දසේන | 53,618 |
| කේ.පී.එස්. කුමාරසිරි | 49,030 |
| **සමගි ජන බලවේගය** | |
| අබ්දුල් රහුමාන් ඉස්හාක් | 49,298 |
| විජේසුන්දර මුදියන්සේලාගේ රෝහණ බංඩාර විජේසුන්දර | 39,520 |

## 18 පොළොන්නරුව

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| මෛත්‍රීපාල සිරිසේන | 111,137 |
| අනුරුද්ධ රණසිංහ ආරච්චිගේ රොෂාන් | 90,615 |
| ගමලත් සිරිපාල | 67,917 |
| අමරකීර්ති අතුකෝරළ | 45,939 |
| **සමගි ජන බලවේගය** | |
| හේවා ගජමන් පත්තිනිගේ කිංස් කුමාර් නෙල්සන් | 22,392 |

## 19 බදුල්ල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| නිමල් සිරිපාල ද සිල්වා | 1,41,901 |
| සුදර්ශන දෙනිපිටිය | 71,766 |
| අමිත් තේනුක විදානගමගේ | 68,338 |
| දොන් ආතර් චාමර සම්පත් දසනායක | 66,393 |
| අවන්ස්ලම් පෙරේරා බෝදියාබදුගේ ඩිලාන් ප්‍රියන්ජන් | 53,081 |
| ආරච්චිගේ චමින්ද ජානක තිසකුට්ටි | 50,151 |
| **සමගි ජන බලවේගය** | |
| වඩිවේලු සුරේෂ් | 49,762 |
| අ. අරවින්ද් කුමාර් | 45,497 |
| ලොකුගස්තොට විතාරණගේ චමින්ද විජේසිරි | 36,291 |

## 20 මොණරාගල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| ශෂීන්ද්‍ර රාජපක්ෂ | 1,04,729 |
| කුමාරසිරි රත්නායක | 91,530 |
| විජිත බේරුගොඩ | 68,984 |
| අ.ප.ජගත් පුෂ්පකුමාර | 66,176 |
| ගයාෂාන් නවනන්ද | 45,384 |
| **සමගි ජන බලවේගය** | |
| ධර්මසේන විජේසිංහ හේරත් මුදියන්සේලාගේ | 20,662 |

## 21 රත්නපුර

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| වන්නිආරච්චි පවිත්‍රා දේවි | 2,00,977 |
| හල්කඳලිය ලේකම්ලාගේ ප්‍රේමලාල් ජයසේකර | 1,42.037 |
| ජානක වක්කුඹුර | 1,01,225 |
| ගාමිණී වලේබොඩ | 85,840 |
| අකිල එල්ලාවල | 71,179 |
| වාසුදේව නානායක්කාර | 66,991 |
| මුදිතා ප්‍රශාන්ති | 65,933 |
| ජෝන් සෙනෙවිරත්න | 61,612 |
| **සමගි ජන බලවේගය** | |
| අංකුඹුර ආරච්චිගේ හේෂාන් විජය විතානගේ | 60,426 |
| උඩගම ලියනගේ වරුණ ප්‍රියන්ත ලියනගේ | 47,494 |
| තලතා අතුකෝරල | 45,105 |

## 22 කෑගල්ල

| | |
|---|---|
| **ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ** | |
| කනක හේරත් | 1,28,592 |
| රංජිත් සියඹලාපිටිය | 1,03,300 |
| තාරක බාලසූරිය | 96,763 |
| රාජිකා වික්‍රමසිංහ | 68,802 |
| එච්.ආර්.එස්.දුෂ්මන්ත | 58,306 |
| උදයකාන්ත ගුණතිලක | 46,628 |
| එල්.එච්.සුදත් මංජුල | 45,970 |
| **සමගි ජන බලවේගය** | |
| කබීර් හෂීම් | 58,716 |
| කසෙද්රූගේ සුජිත් සංජය පෙරේරා | 28,082 |

# 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ විශේෂ අවස්ථා



මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව දේශපාලන පක්ෂ ලේකම්වරුන් සමග පැවති සාකච්ඡාව



පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කළ සෞඛ්‍ය මාර්ගෝපදේශ වාර්තාව මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදීමේ අවස්ථාව



පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයින්ගේ නාමයෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව දැනුවත් කිරීමේ අවස්ථාව





මැතිවරණ කාලසීමාවේ දී විද්‍යුත් මාධ්‍ය භාවිතාව හා මාධ්‍ය උපමාන පිළිබඳව දැනුවත් කිරීමේ අවස්ථාවක්



මැතිවරණ කාලසීමාවේ දී විද්‍යුත් මාධ්‍ය භාවිතාව පිළිබඳව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තුළ පැවැත්වූ මාධ්‍ය හමුව



පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව පොලිස් දෙපාර්තමේන්තුව සමඟ පැවති විශේෂ සාකච්ඡාව



පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාව තුළ අපේක්ෂක ප්‍රවර්ධන කටයුතු උදෙසා සියලු ආගමික ස්ථාන හා පූජ්‍ය පක්ෂයේ මැදිහත්වීම සම්බන්ධව සභාපතිවරයා, මැතිවරණ කොමසාරිස් ජනරාල් ඇතුළු නිලධාරීන් විසින් මල්වතු අස්ගිරි පාර්ශවයේ හා රාමඤ්ඤ නිකායේ මහනායක හිමි වරුන් බැහැ දකින ලදුව අදාළ කරුණු සම්බන්ධව විහිදී සාකච්ඡා කිරීමේ අවස්ථාව

# මැතිවරණ ආරවුල් නිරාකරණයෙන් මැතිවරණ නීති බලාත්මක කිරීමකට සීමා වීම හා 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ මැතිවරණ පැමිණිලි කළමණාකරණ අත්දැකීම්




සුරංග රණසිංහ
සහකාර මැතිවරණ කොමසාරිස් - මැතිවරණ ආරවුල් නිරාකරණ

2020 පාර්ලිමේන්තු මැතිවරණය නෛතික සීමාවන්ගෙන් ඔබ්බෙහි වූ බොහෝ උපාය උපක්‍රම ප්‍රායෝගිකව භාවිතයේ යෙදවීමේ අභියෝගය සාර්ථකව ජයගත් මැතිවරණයක් විය. පාලිත කෝවිඩ්-19 තත්ත්වයක් යටතේ දින 158ක් පුරා පැවති 2020 පාර්ලිමේන්තු මැතිවරණය මෙතෙක් පැවති දීර්ඝතම ජාතික මැතිවරණ කාල සීමාවක් ලෙස ඉතිහාසගත විය. පාර්ලිමේන්තු මැතිවරණයක මනාප වෙනුවෙන් සිදුකෙරෙන නොවැළැක්විය හැකි තරගය හමුවේ සිදුවන මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් වලට අමතරව කෝවිඩ්-19 තත්ත්වය යටතේ තිබූ ප්‍රචාරක සීමාවන් මධ්‍යයේ මැතිවරණ තරග භූමිය තුළ ප්‍රායෝගික සමබරතාවක් පවත්වා ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට දැඩි උත්සාහයක් ගැනීමට සිදුවිය. මැතිවරණ වියදම් නියාමනය, මැතිවරණ කාල සීමාවක ජනමාධ්‍ය නියාමනය සම්බන්ධයෙන් නෛතික ප්‍රතිපාදන නොමැති වීම සහ රාජ්‍ය බලය හිමි හා අහිමි අපේක්ෂකයන් (එක් පක්ෂයකම වුවද) අතර ඇති බල හා මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් ඇති විෂමතාවන් ඉහත තත්ත්වය වඩාත් සංකීර්ණ හා තීව්‍ර බවකට පත්කළ බව නිරීක්ෂණය වේ. මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත ලද පැමිණිලි සම්බන්ධ සාම්ප්‍රදායික නිරීක්ෂණවලට අනුව සමස්ත මැතිවරණ ක්‍රියාදාමයම නිදහස් හා සාමකාමී වටපිටාවක් තුළ පැවතිණි. 2020 මාර්තු මස 02 වන දිනයෙන් ආරම්භ වී අගෝස්තු මස 09 වන දින දක්වා වූ කාලය තුළ සමස්ත මැතිවරණ පැමිණිලි 13,919 ක් හා විමසීම් 1,503 ක් සම්බන්ධ මැදිහත්වීම්, මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය හා මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන විසින් සිදුකර ඇත. එම පැමිණිලි අතරින් 8,600ක් මැතිවරණ නීති උල්ලංඝණය කිරීම් ලෙසත්, 83 ක් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා ලෙසත් 5,236 ක් සමාජ මාධ්‍ය ඔස්සේ හඳුනාගත් පැමිණිලි ලෙසත් වර්ගීකරණයට ලක් කරන ලදි.

**සමස්ත පැමිණිලි වර්ගීකරණය**




සටහන I


2019 පශ්චාත් මැතිවරණ කාලසීමාවේ දී පුරෝකතනය කළ පරිදිම ප්‍රචාරණයට අදාළව මැතිවරණ නීති උල්ලංඝනය වීම් අතර ප්‍රධාන ලෙසට ඉස්මතු වන කාරණා කිහිපයක් හඳුනාගත හැකි විය. එනම් කෝවිඩ්-19 තත්ත්වය යටතේ පැවති ප්‍රචාරක සීමා උල්ලංඝනය කිරීම් මෙහිදී නොසලකා හරින ලද අතර පවතින පනතේ නීති ප්‍රතිපාදන මත පමණක් විග්‍රහය සිදුකරන ලදි. එනම් ආගමික වැඩසටහන් හා ආගමික නායකයන් පක්ෂ/ අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා යොදාගැනීම, ජනමාධ්‍ය හැසිරීමේ පැහැදිලි අසමබර බව හා සමාජ මාධ්‍ය ප්‍රචාරණය ප්‍රධානතම සාධකයක් ලෙස ඉස්මතුවීම හා රාජ්‍ය දේපළ අයථා පරිහරණය සම්බන්ධයෙන් වන පැමිණිලිවල වර්ධනය යනාදියයි. අමතර වශයෙන් ලැබුණු පැමිණිලි බොහෝමයක් එක් පක්ෂයක/කණ්ඩායමක අපේක්ෂකයන් විසින් තම පක්ෂයේම වෙනත් අපේක්ෂකයන්ට විරුද්ධව කරන ලද පැමිණිලි විය. ලද පැමිණිලිවල සංඛ්‍යාත්මක වර්ධනයක් පෙන්නුම් කරන අතර ම පැමිණිලිවල ගුණාත්මක බවද සාපේක්ෂව ඉහළ අගයක පැවතිණි. එනම් ස්මාර්ට් ජංගම දුරකථන භාවිතයෙන් ලබාගත් පැමිණිල්ල ට අදාළ ඡායාරූප හෝ වීඩියෝ සාක්ෂි මගින් බොහෝ පැමිණිලිවල ගුණාත්මකභාවය වර්ධනය කර තිබූ අතර, එය සෑම පැමිණිල්ලක්ම සුළු වුව ද මග නොහැර අවධානය යොමු කිරීම උදෙසා මැතිවරණ පැමිණිලි කළමනාකරණ නිලධාරීන්ට මෙන්ම පොලීසිය ට ද බල කරන තත්ත්වයක් විය.

**2020.03.02 දින සිට 2020.08.07 දින දක්වා මැතිවරණ නීති උල්ලංඝනය වීම් සම්බන්ධ පැමිණිලි වර්ගීකරණය**

| පැමිණිලි වර්ගීකරණය | ප්‍රතිශතය | සංඛ්‍යාව |
|---|---|---|
| නීති විරෝධී පෝස්ටර්/ බැනර්/කටවුට් ප්‍රදර්ශනය කිරීම/ අත්පත්‍රිකා බෙදීම | 49% | 4205 |
| ද්‍රව්‍ය බෙදා හැරීම/ පරිත්‍යාග කිරීම/ මුදල් බෙදාදීම/ ඉඩම් ඔප්පු බෙදාදීම/ විවෘත කිරීම | 11% | 929 |
| රැස්වීම් / පෙළපාලි පැවැත්වීම/ නීති විරෝධී දේශපාලන කාර්යාල පත්වාගෙන යාම | 10% | 883 |
| චංචල හා නිශ්චල පොදු දේපල අයථා පරිහරණය | 7% | 563 |
| රාජ්‍ය නිලධාරීන් දේශපාලන කටයුතුවල යෙදීම/ යෙදවීම | 6% | 518 |
| • ඡන්ද ප්‍රකාශ කිරීමට බාධා කිරීම<br>• ඡන්ද දායකයින්ට සංග්‍රහ කිරීම<br>• රාජ්‍ය නිලධාරීන් පත් කිරීම/ උසස් කිරීම/ මාරු කිරීම<br>• ඡන්ද පොළ/ මැතිවරණ කාර්ය මණ්ඩල/ මැතිවරණ ද්‍රව්‍ය හා උපකරණ පිළිබඳ පැමිණිලි<br>• ආගමික නායකයන් හරහා ප්‍රචාරණ කටයුතු කිරීම<br>• ප්‍රචාරණ කටයුතු සඳහා ආගමික ස්ථාන යොදා ගැනීම<br>• නීති විරෝධී උත්සව සංවිධානය<br>• අසත්‍ය ප්‍රචාර/ ව්‍යාජ පුවත් මැවීම/ වෛර ප්‍රකාශ/ අපහාස කිරීම/ ජාතිවාදී ප්‍රකාශ<br>• විද්‍යුත් මාධ්‍ය අවභාවිතය<br>• සමාජ මාධ්‍ය මගින් සිදු කරන ප්‍රචාරණ කටයුතු<br>• තැපැල් ඡන්දවලට අදාළ පැමිණිලි<br>• මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලට බාධා කිරීම<br>• පශ්චාත් මැතිවරණ පැමිණිලි | 17% | 1502 |
| | මුළු එකතුව | 8600 |

සටහන II

2020.03.02 දින සිට 2020.08.05 දින දක්වා දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථාන වෙත වාර්තා වූ පැමිණිලි සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව වර්ගීකරණය





සටහන III

2020.03.02 දින සිට 2020.08.05 දින දක්වා ප්‍රචණ්ඩ ක්‍රියා වර්ගීකරණය

| පැමිණිලි වර්ගීකරණය | ප්‍රතිශතය | සංඛ්‍යාව |
|---|---|---|
| පහරදීම/ මැර ප්‍රහාර එල්ල කිරීම | 37% | 31 |
| වාචික බිය ගැන්වීම් | 29% | 24 |
| දේපළවලට හානි කිරීම/ දේපළ පැහැර ගෙන යාම | 11% | 9 |
| මැතිවරණ ප්‍රචාරක කාර්යාලවලට/ පෝස්ටර්/ බැනර් ආදියට හානි කිරීම | 10% | 9 |
| ආයුධ පෙන්වා බිය ගැන්වීම/ වෙඩි තබා මැරීමට තැත් කිරීම | 5% | 4 |
| ගිනි තැබීම් (3), පුද්ගල පැහැරගෙන යාම් (1), වෙඩි තැබීම් (1), කෝලාහල කිරීම/ රැස්වීම් පැවැත්වීමට බාධා කිරීම (1) | 7% | 6 |
| | මුළු එකතුව | 83 |

සටහන IV

2020.03.02 දින සිට 2020.08.05 දින දක්වා පැමිණිලි සංඛ්‍යාව දිනය අනුව විචල්‍ය වීම ප්‍රතිශතයක් ලෙස




සටහන V

මැතිවරණ පැමිණිලි විශ්ලේෂණයේ දී වැදගත් සාධකයක් වන්නේ වාර්තා වන සෑම පැමිණිල්ලක්ම මැතිවරණ ක්‍රියාවලිය කෙරෙහි කෙතරම් බලපෑමක් කරනු ඇති ද යන්නයි. මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකක වෙත වාර්තා වන පැමිණිලි 98% ක් පමණ සාමාන්‍ය හෝ සුළු බලපෑම් ඇති කරන පැමිණිලි ලෙස බරතැබීම් සිදු කර ඇත. මෙම බොහොමයක් පැමිණිලි පනතේ සඳහන් යම් නිශ්චිත වගන්තියක් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කළ යම් විධානයක් උල්ලංඝනය කිරීමක් වේ. කෙසේ නමුත් මැතිවරණයට බරපතල ලෙස බලපෑම් කරන සිද්ධි ලෙස හඳුනාගත් බොහෝ පැමිණිලි (ප්‍රචණ්ඩ ක්‍රියා හැර) පනතේ නීතිමය ප්‍රතිපාදනවලින් ආවරණය නොවන ක්‍රියා ලෙස හඳුනාගත හැකිය. නීතිය කාලානුරූප නොවීම වර්තමානයේ පවතින සංකීර්ණ බව හමුවේ සිදු කරනු ලබන තාක්ෂණික රිංගායෑම් ඒ අතර බහුල වේ. මෙවන් සිද්ධීන් නීතියෙන් ආවරණය නො වන්නේ යැයි පවසා බැහැර කිරීමේ හැකියාවක් මැතිවරණ කොමිෂන් සභාවට කිසිසේත්ම කළ නොහැකි අතර මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමේ මූලෝපායන් යෙදීමේ වගකීම අරබයා මෙවන් අවස්ථාවල දී බොහෝ විකල්ප ක්‍රමවේද අත්හදා බැලීමට අත්‍යවශ්‍ය විය.

## ජනමාධ්‍ය

රාජ්‍ය මෙන්ම බොහෝ ජනප්‍රිය පෞද්ගලික විද්‍යුත් නාලිකා ද එක් තෝරාගත් දේශපාලන පක්ෂයක් හෝ මතවාදයක් වෙනුවෙන් පමණක් පක්ෂග්‍රාහීව කටයුතු කරන බවට බොහෝ පැමිණිලි මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබිණි. ඇතැම් පැමිණිලිවලට අනුව රාජ්‍ය බලය හෝ වෙනත් ආකාරයකින් මාධ්‍ය ආකර්ෂණය හිමිකරගන්නා තෝරාගත් අපේක්ෂකයන් කිහිප දෙනෙකුට පමණක් වැඩි වශයෙන් මාධ්‍ය අවකාශ භාවිතා කිරීමට ඉඩදෙන බවට වන පැමිණිලි තිබූ අතර, ඒවා බොහෝමයක් එකම පක්ෂයේම අනෙකුත් තරගකරුවන් අතරින්ම යොමු වූ පැමිණිලි විය. මාධ්‍ය උපමාන නිකුත් කිරීමට අමතරව හඳුනාගත් පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත්වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදුකළ අතර, නිරන්තරයෙන් පැවති මාධ්‍ය ප්‍රධානීන්ගේ සහ පුවත්පත් කර්තෘවරුන්ගේ සාකච්ඡා මගින් හැකිතාක් දැනුවත් කිරීම් හා එකඟතා මත මාධ්‍ය සමබරතාවක් පවත්වා ගැනීමේ උත්සාහයක යෙදෙන්නට මැතිවරණ කොමිෂන් සභාවට සිදුවිය. ඉතා සීමිත නෛතික ප්‍රතිපාදන හමුවේ වුව ද ගත හැකි උපක්‍රමශීලි විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාව විසින් ස්වකීය අවධානය ඉදිරි කාල සීමාව තුළ යොමු නොකළහොත්, මාධ්‍ය යනු තවදුරටත් මැතිවරණයක ජනමතයේ දිශානතිය තීන්දු කෙරෙන ප්‍රධානතම මෙවලමක් වුව ද එය කිසිදු ආකාරයක නෛතික, ආචාරධර්මික හෝ ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම හා එකඟ නොවන සමාජ අවකාශයක් ලෙස පවතිනු ඇත. එබැවින් ඉදිරි මැතිවරණයක දී දිගින් දිගටම මාධ්‍ය උපමාන උල්ලංඝනය කරන මාධ්‍ය ආයතනවලට එරෙහිව මතු සඳහන් විකල්ප ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාව සලකා බැලිය යුතු අතර එය සෑම විට ම නිදහස් මාධ්‍ය කෙරෙහි අහිසි බලපෑම් එල්ල නොකරන බවට තහවුරු කෙරෙන සාමූහික ක්‍රියාවලියක් ලෙස ද සිදුවිය යුතු ය. එම යෝජනා වන්නේ;

1. අදාළ මාධ්‍ය ආයතන සාමාජිකයන් ගෙන්වා ඒ පිළිබඳව දැනුම්වත් කිරීම;
2. මාධ්‍ය ආයතන එක් දේශපාලන පක්ෂයකට/ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට පමණක් පක්ෂව කටයුතු කරන බවට කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ ප්‍රකාශයක් කිරීම;
3. මෙම තත්ත්වය ඡන්ද විමසීමේ විනිවිදභාවයට බාධා පමුණුවන බැවින් මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදන හෝ ප්‍රතිඵල විකාශය සඳහා සෘජුව දායක කර නො ගැනීම;
4. හඳුනාගත් මාධ්‍ය ආයතන සඳහා විකාශන කටයුතු සිදු කරගෙන යාම සඳහා ලබා දී ඇති විකාශන බලපත්‍රය තාවකාලිකව අත්හිටුවන ලෙස ජනමාධ්‍ය අමාත්‍යංශයට හෝ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට නියෝග කිරීම, හා
5. රාජ්‍ය මාධ්‍ය සම්බන්ධයෙන් වනවිට, රාජ්‍ය මාධ්‍ය ප්‍රධානීන් පිළිබඳව අදාළ විනය බලධාරීන් වෙත දන්වා ඒ සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීම.

## සමාජ මාධ්‍ය

මැතිවරණ නීති උල්ලංඝනය, සිදු වූ ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව, ජනමාධ්‍ය භූමිකාව මෙන්ම සුපිලිපන්න මැතිවරණයක ප්‍රධාන මිනුම් නිර්ණායකයක් ලෙස මැතිවරණ කාල සීමාව තුළ

සමාජ මාධ්‍ය හැසිරීම යන්න නව මානයක් ලෙස මැතිවරණ ක්‍රියාවලිය තුළ තහවුරු වූ මැතිවරණයක් ලෙස 2020 පාර්ලිමේන්තු මැතිවරණය හඳුනාගත හැකිය. සාම්ප්‍රදායික මැතිවරණය නිරීක්ෂණවලට අභියෝගයක් වෙමින් මැතිවරණ නීති උල්ලංඝනය, සමාජ මාධ්‍යජාලවල පරිශීලක ප්‍රමිතීන් උල්ලංඝනය මෙන්ම මැතිවරණ ප්‍රචාරක වියදම් සම්බන්ධයෙන් ද තොරතුරු හා පැමිණිලි ලබා දෙන මාධ්‍යයක් ලෙස සමාජ මාධ්‍ය මැතිවරණ කාල සීමාව තුළ සුවිශේෂී භූමිකාවක් සිදුකරන ලදී. දිනකට ඇමෙරිකානු ඩොලර් 300 ක පමණ ප්‍රමාණයක් දක්වා වියදම් කරමින් තම ප්‍රවර්ධනමය කටයුතු සඳහා සමාජ මාධ්‍ය අවකාශ යොදාගැනීමට අපේක්ෂකයන් කටයුතු කළ බව නිරීක්ෂණය විය. එසේම නිහඬ කාලයේ මෙන්ම ඉන් පූර්වයේත් සමාජ ජාල ආශ්‍රිතව හඳුනාගත් මැතිවරණ නීති උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් පැමිණිලි 5,236 ක් පමණ වාර්තා විය. පොදු සාමාජීය අවකාශයක් වුව ද පරිශීලකයා සතුව පූර්ණ පාලනය ඇත යන  නිර්ණායක මත හිඳිමින් සාම්ප්‍රදායික ප්‍රචාරණ උපක්‍රම පාලනය සඳහා ඇති නීති රීති සමාජ මාධ්‍ය ජාල කෙරෙහි ද උපයෝගී කොටගත්ත ද, අපේක්ෂකයන් විශාල ප්‍රමාණයක් තරග කරන අවස්ථාවක එම නෛතික රාමුව හෝ තාක්ෂණික සීමාවන් ප්‍රමාණාත්මක නොවන බව හොඳින්ම තහවුරු විය. විශේෂයෙන්ම නිහඬ කාලය තුළ අනෙකුත් පොදු මාධ්‍ය අවකාශ මැතිවරණ ප්‍රචාරණයට අදාළව නිෂ්ක්‍රීය වුව ද සමාජ මාධ්‍ය නිෂ්ක්‍රීය කිරීම හෝ යම් පාලනයක් තුළ ගෙන වීම පවා ඉතා අසීරු අභියෝගයක් විය. මෙම තත්ත්වය කෙරෙහි යම් පාලනයක් ඇතිකර ගැනීම සඳහා පළමුව නිහඬ කාලය තුළ සමාජ මාධ්‍ය මැතිවරණ ප්‍රචාරණ දැන්වීම් හා අනෙකුත් සංවිධානාත්මක ප්‍රචාරණ වැළැක්වීම සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබාගැනීම සඳහා සමාජ ජාල හිමිකරුවන් සමඟ එකඟතාවට එළඹිය යුතු ය. මැතිවරණ කාලසීමාවේ දී සමාජ ජාල භාවිතය සම්බන්ධයෙන් අපේක්ෂකයින්, පක්ෂ/කණ්ඩායම්, රජයේ නිලධාරීන් දැනුවත් කිරීම් වර්ධනය කිරීම කාලෝචිත වේ. අවසානාත්මක උපක්‍රමයක් ලෙස සමාජ ජාල ඔස්සේ හඳුනාගන්නේ වුව ද නිශ්චිත මැතිවරණ නීති උල්ලංඝනයවීම් සඳහා නෛතික ක්‍රියාමාර්ග ගන්නා බවට පොලීසිය විසින් තහවුරු කර පෙන්විය යුතු ය.

**2020.08.02 දින සිට 2020.08.05 දින දක්වා වූ නිහඬ කාලසීමාව තුළ වාර්තා වූ සමාජ මාධ්‍ය අවභාවිතය සම්බන්ධ පැමිණිලි**

| දිනය | වර්ග | ෆේස්බුක් ආයතනය වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව | ඉවත් කරන ලද සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 2020.08.02 දින මධ්‍යම රාත්‍රී 12 සිට 2020.08.05 දින දක්වා නිහඬ කාලය | Ads (දැන්වීම්) | 2873 | 2873 | 100% |
| | Links (මැතිවරණ නීති උල්ලංඝන ලෙස හඳුනාගන්නා ලද පැමිණිලි) | 1766 | 1732 | 98% |
| | **මුළු සංඛ්‍යාව** | **4639** | **4605** | **99%** |

සටහන VI

**(මූලාශ්‍රය: ෆේස්බුක් ආයතනය විසින් තහවුරු කරන ලද තොරතුරු)**

## ආගමික ස්ථාන හා ආගමික වැඩසටහන්

1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 79 වන වගන්තිය ප්‍රකාරව වන අයථා බලපෑමක් ලෙස හඳුනාගැනෙන ආගමික වැඩසටහනක දී හෝ ආගමික ස්ථානයක සිදු කරනු ලබන මැතිවරණය ප්‍රචාරණ කටයුතු සම්බන්ධ බොහෝ පැමිණිලි මැතිවරණ කොමිෂන් සභාව වෙත ලැබිණි. පුද්ගලික ආධ්‍යාත්මික විශ්වාසයක් පදනම් කොට ගෙන සිදුකරන ආගමික කටයුත්තක දී ඔවුන් විශ්වාස කරන ආගමික ශාස්තෘවරුන් විසින් හෝ ඔවුන් විසින් පූජනීයත්වයේ ලා සලකනු ලබන ස්ථානයක දී හෝ යම් දේශපාලනික ලැදියාවක් කෙරෙහි පෙළඹවීමක් හෝ එවන් යමකින් ඉවත්වීම සඳහා සිදු කරනු ලබන බලපෑමක් බරපතළ වරදක් ලෙස හඳුනාගන්නා අතර ඒ සඳහා වරදකරුවකු වීම තමාගේ ධුරය අහෝසි වීමට පමණක් නොව ප්‍රජා අයිතිය වසර 6ක් දක්වා අහෝසි වීම දක්වා වුව ද දඬුවම් හිමිවන බව පාර්ලිමේන්තු මැතිවරණ පනතේ දක්වා ඇත. ආගම හෝ ආගමික ස්ථාන ප්‍රචාරණය සඳහා යොදා ගැනීම මැතිවරණ නීතිය හමුවේ වරදක් වන අතරම එය දේශපාලන සදාචාරය ප්‍රශ්න කෙරෙන බරපතල ආචාරධාර්මික ගැටළුවක්ද වේ. විශ්වාස යනු සෑමවිටම තාර්කික භාවිතයෙන් තොරව පිළිගන්නා පෞද්ගලික/ සාපේක්ෂ සත්‍යයක් වන අතර එවන් ලබ්ධියකට බැඳී තැනැත්තෙකු උපක්‍රමශීලීව ලෞකික දේශපාලනමය කාර්යයක් සඳහා පෙළඹවීම යනු ආචාරධාර්මික වශයෙන් වුව ද අයුතු ලෙස සිදුකරන වංචාවක් ලෙස හඳුනාගත හැකිය. මෙවන් නීති උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් ලද බොහෝ පැමිණිලි පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමෙන් පසුව සුදුසු නීතිමය පියවර ගන්නා ලෙස දන්වමින් පොලිසිය වෙත සිද්ධීන් 11 ක් පමණ වාර්තා කරන ලදී. මෙම තත්ත්වය වළක්වාගැනීමේ පියවරයන් ලෙස සර්ව ආගමික නායකයන් දැනුම්වත් කිරීම මගින්, අමාත්‍යාංශ මට්ටමින් සියලු ආගමික ස්ථාන දැනුවත් කිරීම් හා ප්‍රචාරක දැන්වීම් නිර්මාණය කර ප්‍රචාරය කිරීම වැනි උපක්‍රම මගින් මහජනයා, අපේක්ෂකයින් ගරු පූජ්‍ය/ පූජකවරුන් දැනුම්වත් කිරීමට මැතිවරණ කොමිෂන් සභාව පියවර ගන්නා ලදී. නීතිමය ප්‍රතිපාදන හා  ආචාර ධාර්මික කියවීම් මත මෙවන් සිද්ධීන් බරපතල වැරදි වුව ද මෙම සිද්ධීන් හි ගැටුම් වැඩිකිරීමේ සංවේදීතාව සලකා මැතිවරණ පැමිණිලි කළමනාකරණ නිලධාරීන් මෙන්ම පොලීසිය ද නිසි ක්‍රියාමාර්ග ගැනීමට බොහෝ සේ මැලි වේ. එසේ හෙයින් මේ සම්බන්ධව අඛණ්ඩ දැනුවත් කිරීම් සහ හඳුනාගත් සිද්ධීන් සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීම් යන දෙආකාරයට සම බරතැබීමෙහි ලා කළ යුතු කාර්යයන් දෙකකි.

## රාජ්‍ය දේපළ අයථා පරිහරණය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 උ උ වගන්ති ප්‍රකාරව මැතිවරණ කාල සීමාවක දී රාජ්‍ය නිලධාරීන් හා දේපල අවභාවිත නොකිරීම තහවුරු කිරීම සඳහා විධාන පැනවීම හා අවශ්‍ය සුදුසු ක්‍රියාමාර්ග ගැනීමටත් ඒවාට අනුගතවීමටත් රාජ්‍ය නිලධාරීන් බැඳී සිටී. රාජ්‍ය දේපල යන්න භෞතික හා මානව සම්පත් පමණකටම සීමා නොවන අතර දේශපාලන අයිතිවාසිකම් අහිමි නිලධාරීන් රාජකාරීමය නො වන කාලයේ දී වුව සිදුකරන කටයුතු හා තනතුරු නාමයන් මෙන්ම මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ රාජකාරී කාලය ද එයට ඇතුළත් වේ. මෙසේ රාජ්‍ය සම්පත් මැතිවරණ කාල සීමාවේ දී සුවිශේෂී කොට හඳුනාගැනීමට අවශ්‍ය වනුයේ, රාජ්‍ය දේපළ පාලනය සම්බන්ධයෙන් බලයක් හිමිවන්නේ තරග කරනු ලබන අපේක්ෂකයන්ගෙන් සීමිත පිරිසකට පමණක් වන හෙයින් එය, තීරණ ගැනීම්, තම තනතුරු නාමය භාවිතා කිරීම්, රාජ්‍ය නිලධාරීන් කෙරෙහි නියෝග දීම් හෝ නිශ්චල හෝ චංචල දේපල භාවිතා කිරීම් ලෙස විවිධ ආකාරයෙන් විය හැකිය. යම් තනතුරක් දැරීම නිසාම මහජනයා සතු සම්පත් තම පෞද්ගලික මැතිවරණ ප්‍රචාරණය සඳහා යොදා ගැනීම බරපතල වරදක්

ලෙස හඳුනා ගැනෙන්නේ එබැවිනි. මෙහිලා වූ එක් ප්‍රධානතම පැමිණිල්ල වූයේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමත් සමගම තම ධුර අහිමිවූ රාජ්‍ය හා නියෝජ්‍ය අමාත්‍යවරුන් තමන්ට හිමිව තිබූ වාහන හා නිල නිවාස මැතිවරණ කාර්යයන් සඳහා යොදවන බවට වූ පැමිණිල්ලයි. මේ සම්බන්ධයෙන් පූර්ණ මැදිහත් වීමක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කළ අතර මුදලක් ගෙවා වාහන ලබාගත හැකිය යන පදනමෙන් නිකුත් කළ කැබිනට් පත්‍රිකාව අවලංගු කිරීමටත්, වාහන භාරදීම සඳහා සහන කාලයක් ලබා දී ඉන් ඔබ්බටත් වාහන භාර නොදුන් අයවලුන් සම්බන්ධයෙන් රාජ්‍ය දේපළ අයථා පරිහරණය සම්බන්ධයෙන් නඩු පැවරීමටත් කටයුතු කරන ලෙස දන්වා පොලීසිය වෙත තොරතුරු වාර්තා කිරීමත් සිදු කරන ලදී. මීට අමතරව, උපාධිධාරී පත්වීම් ප්‍රදානය, රජයේ රැකියා දෙන බවට ගෙයින් ගෙට ගොස් සිදු කළ දැනුවත් කිරීම්. කෝවිඩ් සහනාධාර බෙදාහැරීමේ දී හටගත් දේශපාලනමය ස්වරූපයේ මැදිහත්වීම් සම්බන්ධව ලද පැමිණිලි සම්බන්ධයෙන් විශේෂ ප්‍රමුඛතාවකින් යුතුව මැදිහත්වීම් සිදු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව කටයුතු කරන ලදී.

මේ සමානම අයුරින් පළාත් පාලන ආයතනයන්හි ප්‍රධානීන් ලෙස කටයුතු කරමින්ම තම තනතුරුවලින් නිවාඩු ලබා නොගෙන මැතිවරණය සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන්ට තම ධුරයන්ගෙන් නිවාඩු ලබා ගත යුතු බවට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදී. කෙසේ වෙතත් මෙම තීරණය අභියෝගයට ලක් කරමින් කටයුතු කළ පළාත් පාලන නියෝජිතයන්ට එරෙහිව පොලීසිය වෙත පැමිණිලි ගොනු කළ අතර, තම විධායක බලය සම්පූර්ණයෙන්ම වෙනත් නිලධාරියෙකුට පවරා නිවාඩු ලබා නොගෙන මැතිවරණයට ඉදිරිපත්වීම සඳහා වන ඔවුන්ගේ යෝජනාව හා පසුව මැතිවරණ කොමිෂන් සභාව එකඟ විය.

රාජ්‍ය සම්පත් යනු එක් අතකින් මහජනයා සතු දේපළකි. ඒ සම්බන්ධයෙන් තාවකාලික භාරයක් දරන දේශපාලන අධිකාරියක් හෝ රාජ්‍ය නිලධාරියෙකු විසින් හෝ එම දේපළ දේශපාලනමය ප්‍රවර්ධනය කටයුතු සඳහා යෙදවීම යනු බරපතල ගණයේ වගකීම් පැහැර හැරීමක් වන අතර මහජන සම්පත් කෙරෙහි දක්වන සැලකිල්ල ද එයින් මනාව පිළිබිඹු කරයි. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් තුළ මහජන නියෝජිතයන් ලෙස ඉදිරිපත්වන පුද්ගලයෙක් හෝ කණ්ඩායමක් බලය ලබා ගැනීම උදෙසාම රාජ්‍ය දේපල අවභාවිත කරයි නම් එය පැහැදිලිවම මැතිවරණ කාල සීමාවකට පමණක් වලංගු වන කාරණයක්ම ලෙස ලඝුකල හැක්කක් ද නොවේ. රාජ්‍ය නිලධාරීන් යනු මහජන බදු මුදලින් වැටුප් ලබමින් රජයේ රැකියාවක නිරත වන අතරම අනෙක් අතින් මැතිවරණයක දී මැතිවරණ රාජකාරි සදහා සම්බන්ධ වන නිලධාරීන් වේ. මැතිවරණයක සුපිලිපන්න බව තීරණය කරන ප්‍රධානතම සාධකයක් වන නිලධාරීන්ගේ අපක්ෂපාතී බව යන කාරණය රාජ්‍ය දේපළ අයථා පරිහරණයට අනුබල දුන් නිලධාරියෙක් මැතිවරණ රාජකාරි සඳහා යොමුවීම බරපතල ප්‍රශ්න කිරීමකට ලක්විය හැකි කාරණයකි.

## මැතිවරණ නීති බලාත්මක කිරීමකට තම කාර්යය සීමා කර ගැනීම

මැතිවරණ වෘත්තිකයෙකුගේ කාර්යභාරය ඡන්ද පෙට්ටියට පමණක් සීමා නොවිය යුතු ය. මැතිවරණයක් යනු ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක දියුණු සමාජ භාවිතයක් වන අතර මැතිවරණයක් පැවැත්වීමේ පූර්ණ ඵලදායිතාව ලබාගැනීමට නම් පවත්වනු ලබන මැතිවරණයක් සෑම විටම නිදහස් හා සාධාරණ වටපිටාවක පැවතිය යුතු ය. එනම් එක් අතකින් එය ලිඛිත නීතියක පවතින ප්‍රතිපාදන මත ක්‍රියාත්මක විය යුතු අතර  මැතිවරණ තරග භූමිය සැමට සමානව, වඩා විවෘතව සහ අවධාරණය වන අයුරින් ක්‍රියාවලිගත කර තිබීමද අවශ්‍යය. ජන සමූහයක සම්මත ක්‍රියාවලි නීතිමය රාමුවකට ගැනීම හා එසේ ලිඛිතව ඇති නීතියක් උල්ලංඝනය කිරීම සඳහා වන නිශ්චිත දඬුවම් නියම කර තිබීම සාම්ප්‍රදායික නීතියේ ආධිපත්‍ය ක්‍රියාවට නැංවීමකි. කෙසේ නමුත් යම් තත්ත්වයක් යටතේ එම නීතියට අනුගත නොවීම හෝ නීති උල්ලංඝනයට අදාළව දඬුවම් නොපැනවීම සිදුකරන්නේ නම් එවන් ලිඛිත නීතියකින් කිසිදු ප්‍රයෝජනයක් ද නොමැත. නීතියක් ප්‍රායෝගිකව ක්‍රියාත්මක නොවන තාක්කල් එය එක් අතකින් නොසළකා හරින ජන සම්මතයක් වන අතරම ඇතැම් පාර්ශ්වවල එය මර්දනකාරී පීඩාවන් ඇති කරන උපකරණයක් ද ලෙස ක්‍රියාත්මක විය හැකිය. නීතිය බලාත්මක කිරීම සඳහා නිශ්චිත බලය පැවරූ ආයතන පිහිටුවා ඇති අතර ඒවායේ ක්‍රියාකාරීත්වයේ ප්‍රමාණාත්මක බව ද නීතියේ ආධිපත්‍ය තීරණය කරන තවත් ප්‍රධාන සාධකයකි. මේ සියළුම කරුණු ඉතා හොඳින්ම සිදුවේය යන උපකල්පනයක් මත පිහිටා මැතිවරණයක නිදහස් හා සාධාරණ බව ඇති කිරීම ලිඛිත නීතියකට පමණක් සීමා කිරීම කෙතරම් ප්‍රායෝගික ද යන්න මෙම මැතිවරණයේ දී වඩා හොඳින් ඔප්පු කර පෙන්වන ලදී. එයට ප්‍රධානතම හේතුව වූයේ වඩා සංකීර්ණ උපක්‍රම භාවිතා කරමින් සිදුකරන වර්තමාන මැතිවරණ ප්‍රචාරණ උපක්‍රම 1981 තරම් ඈත කාලසීමාවක දී  සම්මත කරන ලද නීතියකින් කෙතරම් දුරට ආවරණය කළ හැකි ද යන කාරණයයි. මෙයට සාක්ෂි සපයමින් මැතිවරණ නීති බලාත්මක කිරීම හමුවේ පාලනය කළ හැකි වූයේ බොහෝ විට සාමාන්‍ය හෝ සුළු මට්ටමෙහි ලා මැතිවරණයට බලපෑමක් කළ හැකි යැයි හඳුනා ගන්නා ලද නිශ්චිත සිද්ධීන් පමණකි.

මැතිවරණ යුක්තිය (Electoral justice) සම්බන්ධව ලොව පිළිගත් මතය වන්නේ පිළිගත හැකි (Credible) නැතහොත් අංගසම්පූර්ණ මැතිවරණ ආරවුල් නිරාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත වීමට නම් මැතිවරණ ආරවුල් වැළැක්වීම (Prevention), ආයතනික/නෛතික ව්‍යුහයේ නිසි ක්‍රියාකාරීත්වය (Institutional) හා විකල්ප (Informal/Alternative)ක්‍රමවේද යන තෙඅංශයම සම සමව ඇතුළත් ක්‍රියාවලියක ට ය.
1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 66 සිට 90 දක්වා වගන්තිවල දක්වා ඇති පරිදි මැතිවරණ වැරදි, දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් නිශ්චිත නීතිමය ක්‍රියාමාර්ග ගතහැකි අතර ඒ සම්බන්ධයෙන් බලය පැවරී ඇති ශ්‍රී ලංකා පොලීසිය මගිනි. ඔවුන් කෙතරම් දුරට එම නීතිය බලාත්මක කිරීම සිදු කරනවා ද නැතහොත් ඊට ඉඩ සලසනවා ද යන්න මෙහි සාර්ථකත්වයේ  ප්‍රධානතම සාධකයකි. කෙසේ නමුත් ලිඛිත නීතියක් සෑමවිටම ඉතා යහපත් මඟ පෙන්වීමක් සිදු කරන අතරම, එය කඩකිරීම නිශ්චිත දඬුවමකට යටත් වන ක්‍රියාවක් හෙයින් ඒ සඳහා අනුගත වීමේ බලකිරීමක් සෑම පාර්ශ්වයක් කෙරෙහිම නිතැතින්ම ඇති කරයි. එහි දී නිසි ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා  උපදේශනාත්මක හා නියාමන මැදිහත්වීමක් කිරීමේ ඉඩකඩක් මැතිවරණ කොමිෂන් සභාවට ඇත.

මැතිවරණ ආරවුල් වැළැක්වීම (Prevention) සඳහා ආකාර තුනක මැදිහත්වීමක් මැතිවරණ කොමිෂන් සභාවට සිදු කළ හැකිය. එනම් මූලික මට්ටමින් ගැටුම් ඇතිවිය හැකි අවස්ථා හඳුනාගැනීම, ක්‍රියාකාරී ලෙස ඒ සඳහා මැදිහත්වීම සහ හඳුනාගත් පියවර ක්‍රියාවට නැංවීම සඳහා වන උත්සාහයන් ගැනීමයි. ද්විතික මට්ටමේ වලක්වා ගැනීම් යනු එම ගැටුම් සිරස් හෝ තිරස් ලෙස වර්ධනය පැතිරවීම වැළැක්වීම

හා ඉන් හටගන්නා හානිය අවම කරවීම සඳහා වන පියවර ගැනීමයි. තෘතීයික මට්ටමෙන් පසු සට්ටන ප්‍රතික්‍රියාවන් ලෙස හට ගත හැකි තත්ත්වය සඳහා පිළියම් යෙදීමයි. මැතිවරණ කොමිෂන් සභාව විසින් බොහෝ විට රාජ්‍ය දේපළ අයථා පරිහරණය සම්බන්ධයෙන් වන ක්‍රියාවලිය පාලනය කිරීම සඳහා වැළැක්වීමේ ක්‍රමවේද විශාල ලෙස භාවිතා කළ අතර ඒ සඳහා වන ගැසට් නිවේදනයට අමතරව උපදෙස් ලිපි 59ක ප්‍රමාණයක් නිකුත් කෙරිණි. මීට අමතරව අවවාද කිරීම්, ස්ථානීය පරීක්ෂණ හා ඒ හා බැඳුනු බොහෝ දැනුම්වත් කිරීම් මගින් වැළැක්වීමේ ක්‍රියාමාර්ග ගැනීම් වැනි බොහෝ ප්‍රායෝගික එළඹුම් සඳහා මැතිවරණ කොමිෂන් සභාව උත්සාහ කරන ලදී.

විකල්ප ක්‍රමවේද නැතහොත් විකල්පමය ආරවුල් නිරාකරණය (Alternative Dispute Resolution) යනු උසාවියක් හෝ නිශ්චිත විනිශ්චය අධිකාරියකින් හැර අන් සියළු සාකච්ඡා, මැදිහත්වීම්, ආරවුල් විසඳීමේ ක්‍රමවේද ක්‍රියාවට නැංවීමයි. මෙවන් ක්‍රියාවන් බොහෝ විට අවසන් වන්නේ පාර්ශ්ව අතර වන ලිඛිත/ අලිඛිත එකඟතා (Agreements) මතය. මැතිවරණ පැවැත්වීම සඳහා පූර්ණ බලය ඇති මැතිවරණ කොමිෂන් සභාවට ඒ සම්බන්ධයෙන් තිබෙන නෛතික බලය ඉක්මවා ගිය සෑම විටම විශේෂ ප්‍රාගුණ්‍යයක් මැතිවරණ කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් ඇත. එය මැතිවරණ වෘත්තිකයන් තුළ කාලයක් තිස්සේ ගොඩනැගෙන "අප්‍රකාශිත දැනුම" (Tacit knowledge) මත පිහිටවූවකි. එම දැනුම භාවිතා කොට යම් සිද්ධියක් අරබයා වැදගත් සේ සැලකෙන සියලු කරුණු සම්බන්ධයෙන් විධිමත් හා විශේෂ නිරීක්ෂණයක් සිදු කළ හැකිය. මෙය " භව්‍යතා ඇගයුම් ක්‍රමය" හෙවත් "ඇස්ප්‍රෝ" (ASPRO) ක්‍රමය ලෙස ද හඳුන්වන අතර එවන් විශ්ලේෂණාත්මක නිගමන කෙරෙහි විනිශ්චයාත්මක අගයක් සෑම විටම ලැබේ. කෙසේ වෙතත් මැතිවරණයක් යනු එක් නිලධාරි කණ්ඩායමක කාර්යයක් පමණක්ම නොවේ. එය සෑම විටම ඒ හා සම්බන්ධ වන සෑම පාර්ශ්වයකම සාමූහික ක්‍රියාවලියකි. තරග කරනු ලබන දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් යනු මැතිවරණයක ප්‍රධානතම පාර්ශ්වකරුවකු වන අතර ඔවුන් කෙරෙහි වන සහකම්පනයක් සෑම තීරණයක් පසුපසම තිබීම මත ඇති කර ගන්නා එකඟතා කෙරෙහි පාර්ශ්වවල බැඳියාව වැඩි කරවයි. එම කාරණය සලකා බලා ඇස්ප්‍රෝ ක්‍රමය මත පදනම්ව මොවුන් සමග නීතියේ සීමාවෙන් ඔබ්බෙහි වන කාරණා සඳහා මත ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා එකඟතාවලට එළඹීමට අනුකලනාත්මක කේවල කිරීම (Integral Bargaining) යන ක්‍රමවේදය යොදා ගත හැකිය. එනම් පාර්ශ්ව අතර අන්‍යොන්‍ය සහයෝගීතාවෙන් යුතුව සාකච්ඡා කිරීමයි. සැමටම වාසි සලසා ගනිමින් පොදු අරමුණක් හෝ අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම සඳහා කේවල කිරීමක් මෙහි දී සිදුවේ. "හෝමන්ගේ න්‍යාය" අනුව මෙවන් කේවල් කිරීමක වැඩි වාසිය සෑම විටම එම කාරණයෙහි විශේෂඥභාවය දරණ මැතිවරණ වෘත්තිකයන් වෙත හිමිවේ. එම නිසා පූර්ණ මැතිවරණ යුක්තියක් මැතිවරණ සමයක ඇති කිරීමට නම් මෙම තෙඅංශයම සම සමව ක්‍රියාත්මක වීම අත්‍යවශ්‍ය වේ.

2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව මෙම ඉහතින් හඳුනාගත් විකල්ප හා වැළැක්වීමේ ක්‍රමවේද නොසලකා හැරිය යුතු බවත් මැතිවරණ නීතිය බලාත්මක කිරීම තුළින් පමණක් මැතිවරණ යුක්තිය ළඟා කරගත යුතු බවට මතයක් ගොඩ නැගුණි. එම මතය ප්‍රමුඛ කාරණයක් ලෙස ඉස්මතු වීම නිසා ඉහතින් හඳුනාගත් බොහෝ ආරවුල් නිරාකරණ ක්‍රමවේද ක්‍රියාවට නැංවීම සෑම පාර්ශ්වයක් අතින්ම මගහැරුණි. එවන් තත්ත්වයක දී සැමවිටම වාසි අත්කර ගන්නේ බලය හා ධනය හිමි තරගකරුවන් පමණක් වන අතර සුළු හෝ බලය අහිමි අපේක්ෂකයන් මැතිවරණ තරගභූමිය තුළින් නිරන්තරයෙන්ම ඉවත් වීමේ ඉඩකඩක් ඇති කරයි. නොඑසේනම් මැතිවරණ වෘත්තිකයන් ලෙස තම කාර්යය සංවිධානාත්මක (logistics) හෝ නෛතික සීමාවන් පමණක් සීමා කරගැනීම වෘත්තීයමය වශයෙන් තම කාර්යය ස්වයං සංකෝචනයකට ලක් කරගැනීමක් වන අතරම, තම වගකීමෙන් ප්‍රධාන කොටසකින් බැහැර වීමේ තත්ත්වයක් ලෙසද අර්ථ දැක්විය හැකිය.

## මැතිවරණ පැමිණිලි කළමනාකරණය යනු මැතිවරණ ආරවුල් නිරාකරණය නොවේ

මැතිවරණ පැමිණිලි කළමනාකරණය යනු යම් නිශ්චිත කාලසීමාවක් අරබයා, යම් නිශ්චිත නීති හා ඒ වෙනුවෙන් වන දඬුවම් ලැයිස්තුවක් මූලික කොටගෙන, කල්තියා හඳුනාගත් ක්‍රමවේදයකට අනුව (එනම් පැමිණිලි භාරගැනීම, වාර්තා තබාගැනීම, අවශ්‍ය අනෙකුත් ආයතන වෙත යොමුකිරීම, පැමිණිල්ල අවසන් කිරීම යන පැමිණිලි කළමනාකරණ ක්‍රියාවලියයි) මැතිවරණ පැමිණිල්ලක් ලද පසු එය අවසාන වන තෙක් සිදුකරන නිසි කාර්යය පටිපාටියයි. මෙම කාර්යය සඳහා කළමනාකරණ කුසලතා සහිත කාර්යය පටිපාටිය පිළිබඳ අවබෝධයක් සහිත ඕනෑම අයෙකුට කළ හැකි කාර්යයකි. එහෙත් මැතිවරණ ආරවුල් නිරාකරණය යනු ඉන් ඔබ්බෙහි වන ආරවුල් වැළැක්වීමේ, ඒවායේ තීව්‍රතාවන් අඩු කිරීමේ හෝ පාලනය කිරීමේ, සමථකරණයේ හෝ කේවල් කිරීමේ, නියම හා ප්‍රමිතීන් පැනවීමේ, ගැඹුරු ලෙස සෑම පාර්ශ්වයකටම සාධාරණයක් වන පරිදි ගැටළුව විශ්ලේෂණය කිරීමේ යන කාර්යයන් ගෙන් සැදුම්ලත් පුළුල් කාර්යයකි. ආරවුල් නිරාකරණය සෑම විට ම අභියෝගාත්මක වන අතර තම පුද්ගල කුසලතාවන්, මැතිවරණ විශේෂඥභාවය, ගැටුම් නිරාකරණ කුසලතා හා නිර්මාණශීලීත්වය මුහුකොට කළ යුතු කාර්යයකි. උදාහරණයක් ලෙස යම් කරුණක් අරබයා කණ්ඩායම් දෙකක් අතර වන නොඑකඟතාවක් සමනය කිරීම සඳහා විශාල වෙහෙසක් හා සහමන්ත්‍රණය (Mediation) සම්බන්ධ කුසලතාවක් තිබිය යුතුය. වෘත්තීය නිපුණත්වය අභියෝගාත්මක වන අවස්ථාවක නිර්මාණශීලීව යෙදවීම යනු සෑම විටම තම වෘත්තිය වපසරියෙන් ඔබ්බෙහි වන ප්‍රතිඵල ළඟා කරගත හැකි අනිවාර්ය අවශ්‍යතාවකි. එසේ හෙයින් මැතිවරණ යුක්තිය නැතහොත් නිදහස් හා සාධාරණ මැතිවරණයක් තහවුරු කිරීම යනු මැතිවරණ නීතිය බලාත්මක කිරීමට පමණක් සීමා විය යුතුය යන සංකල්පයෙන් ඔබ්බෙහි වන අවස්ථා හා ක්‍රමවේද කෙරෙහි ද සැලකිල්ලක් දක්වනු ඇතැයි අපේක්ෂා කරමි.


**Reference**

- Report, 2020 - Parliamentary Elections, Sri Lanka, Election Dispute Resolution Unit, Election Commission of Sri Lanka (2020)
- Conflict – Glossary and Thesaurus (Sinhala Medium), K N O Dharmadasa, (2005)
- International Obligations for Electoral Dispute Resolution Discussion Paper1, February 24 -25, 2009: https://www.cartercenter.org/resources/pdfs/peace/democracy/des/edr-approach-paper.pdf,
- Identifying International Principles for Resolving Election Disputes, Ipp, O., & Hoverter, T. F. (2005)
- The Possibility of Using Alternative Dispute Resolution for Election Law Disputes, Becerra, J. (2018)
- Electoral Dispute Resolution: The Need for a New Sub-Specialty. Foley, E. B. (2012)
- Many Doors--Closing Doors--Alternative Dispute Resolution and Adjudication, Resnik, J. (1994).
- Electoral justice: The international IDEA handbook. International IDEA, Henríquez, J. D. J. O., Ayoub, A., & Ellis, A. (2010)

# පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය.

සුනිල් කුමාරසිංහ අතුකෝරල*



මානවයා සිය පරිණාමික ඉතිහාසයෙන් දිගු කාලයක් ගත කර ඇත්තේ ගෝත්‍රික ජීවිතයකි. ඔවුන් තුළ පැවති සහයෝගිතාව අඛණ්ඩ ජීවන ප්‍රවෘත්තියට හේතු වූ බව ද නිසැක කරුණකි. නිර්වස්ත්‍රව සිටි මානවයා ක්‍රම ක්‍රමයෙන් සිරිත් විරිත් සංස්කෘතික වෙනස්කම් පිළිබඳ සියුම් දර්ශකවලට යොමු වෙනවා ඒ ඒ සංස්කෘතීන් විසින් පිළිගත් ආකාරයන් ඔවුන් පවත්වාගෙන යාමට හුරු පුරුදු විය. මිනිසා ජීවත්වනුයේ සමාජයත් සමගය. අවශ්‍යයෙන්ම සාමූහික වන්නක් වූ මිනිස් ජීවන ක්‍රමය නොනැසී පැවැත්මටත්, සාර්ථක ජිවන ක්‍රමයටත්, ප්‍රජනනය ආදී දේ හේතුකොට ගෙන මානවයන්ට සහයෝගයෙන් සමාජයත් සමග ජිවත්වීමට සිදු විය. නමුත් සිදු වූ සමාජ වෙනස් වීමත් සමග මිනිසුන් තුළ පැවති සාමුහික බව ද වෙනසකට භාජනය විය. ශිෂ්ටාචාරගත මිනිසා අනාදිමත් කාලයක සිට විවිධ විපර්යාසයන්ට ගොදුරු වූ ජීවන ගමනක නිරතව සිටී. මිනිසා සත්වයෙකු වුව ද දිගුකාලීන සමාජානුයෝජනයේ විපාකය තුළින් ඔහු තුළ ඇතිවන ගරුත්වය පිළිබඳ අවබෝධය නිසා ආධ්‍යාත්මික සත්වයෙකු ලෙස සමාජ පිළිගැනිමට ලක්විය.

මේ දක්වා සිදුව ඇති සමාජ වෙනස් වීමට බලපාන ලද හේතු විමසා බැලීම මාතෘකාගත කරුණ ට බෙහෙවින්ම අදාළ වේ. 16 වැනි සියවසේ පමණ සිදු වන ආගමික ප්‍රතිසංස්කරණ, කාර්මික හා තාක්ෂණික දියුණුව සහ දේශපාලන විප්ලව ආදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් බටහිර යුරෝපයේ තාර්කික ධනවාදය පහළ වීමත් එය මැනවින් පවත්වා ගෙන යාමට ප්‍රජාතන්ත්‍රවාදී පරිපාලන රටාව නිර්මාණය වීමත් යන සංසිද්ධි මේ දක්වා සිදුව ඇති සමාජ වෙනස් වීම කෙරෙහි බලපාන ලද මුඛ්‍ය හේතු වෙයි.

19 වන සියවසේ දී ලංකාව, බ්‍රිතාන්‍ය ආධිපත්‍ය යටතට පත්වීමෙන් ඉංග්‍රීසින් ගේ බලපෑම අනෙකුත් ජාතින්ට වඩා (පෘතුගීසීන් හා ලන්දේසීන් ට වඩා) ප්‍රබලව සිදු විය. ස්වාධීන රටක් වශයෙන් නැගි සිටීම නොව ඉංග්‍රීසි ආධිපත්‍යයට නතු වූ දේශීය පාලකයින් යටතේ වුව ද සිදු වූයේ 1796 න් පසු සිදු වූ ධනවාදයේ උදාව ඉමහත් පරිශ්‍රමයකින් පෙරට ගෙනයාමය.

මේ අනුව එම සියවසේ සිදු වූ වැඩවසම් පරිපාලනය දියව ගොස් ධනවාදි ආර්ථික රටාව ඇතිවූයේ බ්‍රිතාන්‍ය පාලනයේ ප්‍රතිඵල වශයෙනි. ලිබරල්වාදය, උපයෝගීතාවාදය, දයාන්විතවාදය, ඉවැන්ජලිකවාදය ආදී දර්ශනවාදවල පිහිටා ඉංග්‍රීසීන් ඔවුන් යටතේ පැවති ආසියාතික රටවල නව මුහුණුවරක් ඇති කළහ. මේ වන විට එංගලන්තය කාර්මික විප්ලවය (ක්‍රි. ව. 1760 - 1830) නිසා ලෝකයේ බලවතා බවට පත්ව සිටියේ ය.

20 වන සියවස උදාව සමග ශ්‍රී ලංකාවේ ජාතික ව්‍යාපාරයෙහි සාමාන්‍ය ජනතාවගේ සහභාගිත්වය අතිශය සීමිත වූවා මෙන්ම එම ව්‍යාපාරයෙහි නායකයත්වය ගත් ලාංකික මධ්‍යම පන්තිය, එවක ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ උද්ඝෝෂණ සඳහා සාමාන්‍ය ජනතාව ගැන කථා කළ ද ඔවුන් ඒ සඳහා සහභාගි කර ගැනීමක් ද නොවුණි. මෙය වඩාත් තහවුරු කළේ 1911 සංගණන වාර්තාව පිළියෙළ කළ ඩෙන්හැම් විසින් ලාංකික මධ්‍යම පන්තිය ගැන කළ ප්‍රකාශය අනුවය. එනම්, "ඔවුන් සියලු දෙන ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලිබරල් අධ්‍යාපනයක් ලබා ඇතත් රට වැසියාට ස්වභාෂාවෙන් බුද්ධිමත් දේශනයක් කළ නොහැකි තත්ත්වයේ පසුවෙති" යනුවෙනි. යාබද රට වූ ඉන්දියාව 1885 ආරම්භ කළ ඉන්දියානු ජාතික සංගමය අධිරාජ්‍ය විරෝධී මාවතකට ජනතාව යොමු කිරීමට ප්‍රබල උත්සාහයක් ගත් නමුදු ලාංකික මධ්‍යම පාන්තික නායකයන් තම උද්ඝෝෂණයට ප්‍රාණයක් ලබා දීමට සාමාන්‍ය ජනතාව සම්බන්ධ කර ගැනීමට උනන්දුවක් නොගත් බව නොරහසකි. එහෙත් පසු කාලීනව මෙය යම් වෙනසකට භාජනය වූ නමුදු ලාංකික පාලක පක්ෂය උනන්දුවක් දැක්වූයේ ඉංග්‍රීසි පාලනයේ දිගුවක් ලෙසට ම සිය පරිපාලනය ඉදිරියට ගෙනයාමය.

''හැම ජාතියක්ම උත්සාහ කළ යුත්තේ අධ්‍යාපන මට්ටමෙන් ජාත්‍යන්තර තත්ත්වයට ගැලපෙන දේශපාලන ක්‍රමයක් ඇති කොට ගැනීමටයි. ඒ හේතුවෙන් කොමියුනිස්ට් ක්‍රමය ජනතාවට ආකර්ෂණීය වන්නේ බහුතරයකට කිසිවක් අයිති නැති නිසාත් ඔවුන් ධනවත් සුළුතරයක් අතින් පීඩාවට පත්වන නිසාත් අනෙක් අතට බහුතරය අයිතිකරුවන් හා සාමාන්‍ය ආර්ථික මට්ටම ඉහළ තත්ත්වයක පවතින රටවලින් එම ක්‍රමයට සුලු ආරාධනයක් තමයි ලැබෙන්නේ, එසේ වුවත් කවර ආකාරයේ ආණ්ඩු ක්‍රමයක් හොඳ ද නරක ද වශයෙන් පොදු තීරණයක් ගත නොහැකි වන්නේ, ජනතාවගේ බුද්ධිමය හා අධ්‍යාපන මට්ටම ඉහළ නැංවීම සහ පොදු සමෘද්ධියක් ඇති කිරීම සඳහා කොන්දේසි විරහිත ඒකඟතාවක් පවතින හෙයිනි. '' යැයි පවසන 'දයිසෙකු ඉකෙදා' නැමැති දර්ශනවේදියා තව දුරටත් සඳහන් කරන්නේ, ජාතියකට ඉහළ මට්ටමේ බුද්ධිමය හා අධ්‍යාපන මට්ටමක් සහ ආර්ථික සමෘද්ධියක් ඇති කළ හැකි පරමාදර්ශී දේශපාලන ක්‍රමය කුමක්ද පෙනෙන හැටියට මේ පිළිබඳ වර්තමාන අදහසෙහි ඒකමතික භාවය වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් බවය." යනුවෙන් පවසන ඔහු මෙයට වැඩි බරක් තබනුයේ ආර්ථික සමෘද්ධියට වඩා සදාචාර මූලධර්ම මගින් මැන බැලිය හැකිය යනුවෙනි.

යහපත් ආණ්ඩුකරණයක් උදෙසා ආත්මාර්ථකාමී සුළුතරය හෝ ආත්මාර්ථකාමී බහුතරය අසමත් වන්නේ යැයි පිළිගත් සම්මතය වෙයි. ව්‍යවස්ථාව මගින් බහුතරයට රජය පැවැත්වීම සඳහා ධනාත්මක බලයක් නොදී ඔවුන්ගේ අතිශය ප්‍රබල අවශ්‍යතාවන් අන්තරායට මුහුණපාන අවස්ථාවක දී රජය පාලනය කිරීමට ඔවුන්ට නිෂේධ බලය පාවිච්චි කිරීම සඳහා සෘණාත්මක බලයක් දෙනවාට වඩා හොඳම පාලන ක්‍රමය විය යුත්තේ ගුණතන්ත්‍ර වාදය බව ට අදහස් දක්වන මහාචාර්ය ආනෝල්ඩ් ටොයින්බී පෙන්වා දෙන්නේ, ගුණතන්ත්‍රවාදය මහජන පාලනයෙන් ඉවත් නොකළ යුත්තේ, විශිෂ්ට හැකියා ඇති ජනතා හැඟීමෙන් යුතු මනුෂ්‍යයන් මිනිස්කමේ කඩාවැටීම්වලට ලක් විය හැකි නිසාත් එමගින් බලය ඔවුන් දූෂණය කළ හැකි නිසාත් බවය. (සරු දිවියට සම්භාෂණයක්, 291 පිටුව)

රාජ්‍ය පාලනය පිළිබඳ රාජාණ්ඩු ඉතිහාසය තුළ වූ රැඩිකල්වාදී හේතුවාදි චින්තනය අභියෝගයට ලක්වීමෙන් රාජාණ්ඩුක්‍රමය වෙනුවට කතිපයාධිපති ක්‍රමය හෙවත් සුළුතර පාලනය ප්‍රජාතන්ත්‍රයක ස්වරූපය ගත්තේය. රදල පාලකයන් වංශය අනුව පත් විය. ආගමේ බලයෙන් පූජකයන් පත් විය. ප්‍රජාතාන්ත්‍රික පාලකයන් පත්වූයේ ධන බලයෙනි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වන මහාචාර්ය කාලෝ පොන්සේකා

පවසන්නේ, "වැඩිහිටි සර්වජන ඡන්ද බලය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදය වූ කලී මිනිසාගේ ඉතිහාසයෙන් ශත වර්ෂයක් පමණ කාලයකට වඩා පැරණි නැති පාලන ක්‍රමයක් බවත් න්‍යාය අනුව නම් එක පුද්ගලයෙකුට එක ඡන්දයක් යන මූලධර්මය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදය දේශපාලන සමානත්වයට කැප වූවක් බවත්ය. එහෙත් ක්‍රියාවේදී නම් ධනය අතින් උග්‍ර අසමානකම් පවතින සමාජවල ප්‍රජාතන්ත්‍රවාදී පාලකයන් වැඩිවශයෙන් තේරී පත්වන්නේ, ඔවුන් සතු ආර්ථික සම්පත්වල බලයෙන් බවය." තව දුරටත් අදහස් දක්වන හෙතෙම අවධාරණය කරන්නේ, "ප්‍රජාතන්ත්‍රවාදී රටක ඡන්ද දායකයින්ගෙන් අතිවිශාල බහුතරය ධනවත් පංතියට අයත් නොවුවත් ඡන්දයෙන් පත්වෙන රටේ පාලකයන්ගෙන් අතිවිශාල බහුතරය අයත් වන්නේ ධනවත් පංතියට ය. ඊට හේතුව ධනය අතින් උග්‍ර අසමානකම් පවතින සමාජයක ධනවතුන්ගේ වස්තුවෙන් කොටසක් බහුතර ජනයා ගේ ඡන්දය ලබා ගැනීම සඳහා යොදවනු ලැබීමයි," යනුවෙනි.

ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සාකච්ඡාවේ දී අප පිළිගත යුතු කරුණක් වන්නේ, සියලු මනුෂ්‍යයන් කෙරෙහි එක සමානව භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අරමුණ කඩිමුඩියේ සපථ කළ හැකි කරුණක් නොවන බවය. එහෙත් කළ හැකි හා කළ යුතු දේ පිළිබඳව කඩිනම් අවධානය යොමු විය යුතු ය. මානව සංහතියේ පැවැත්ම කෙරෙහි ගෝලීය වශයෙන් බලපවත්නා සංකීර්ණ ප්‍රශ්න පිළිබඳව වුව ද අපගේ දායකත්වය කෙබඳු ද, අපේ ආහාර, සෞඛ්‍ය, ආරක්ෂාව, ඇඳුම් පැළඳුම් රැකියා ආදී මූලික අවශ්‍යතා කෙරෙහි විධිමත් සැලසුම් තිබිය යුතු ය. විවිධ කුසලතා හිමි ජනකායක ගේ සිය කුසලතා ඔප්නංවාගෙන නිදහස් අදහස් ප්‍රකාශ කිරීමෙන් ජන ජිවිතය සුඛිත මුදිත කිරීමේ වෑයම ජනතාවට ප්‍රත්‍යක්ෂ කිරීමේ වගකීමෙන් මිදීම ප්‍රජාතන්ත්‍රවාදය සුරක්ෂිත කිරීමක් නොවනු ඇත.
පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය ගැන සාකච්ඡා කිරීමේදී "නීතියේ සාරය" කෘතිය ලෝකයට වැදගත් නිර්වචනයක් ඉදිරිපත් කළේ වසර 1700 ක පමණ දුර කාලයක දීය. එනම් ආණ්ඩුවක ප්‍රධාන බලතල ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන ශාඛා ත්‍රිත්වය එකිනෙකින් වෙන්ව ක්‍රියාත්මක කළ යුතු යැයි ප්‍රංශ දේශපාලන දාර්ශනිකයෙකුවන චාල්ස් මොන්ටෙස්කියු වර්ෂ 1784 දී (ස්පිරිට් ඔෆ් ලෝ) රචනා කරමින් කියා සිටියේ සංවරණ හා තුලන සහිත (එකකට අනෙක් ආයතනය අභිබවා යෑමට නොහැකි) පාලනය ප්‍රජාතන්ත්‍රවාදයට වඩා හිතකර බවය.

සමකාලීන සමාජ පසුබිම අධ්‍යයනය කළ මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද සඳහන් කරන්නේ, ක්‍රමානුකූලව සකස් කළ නීති රීති අපේ රටට නොමැති බවත් 1832 දක්වාම සනාතන සම්ප්‍රදාය පදනම් කර ගත් ජනසම්මත නීතිරීති අනුව රට පාලනය වූ බවත්ය. එසේම "විජාතිකයෝ අප රටේ නීති සම්පාදකයින් මගින් නොඑක්වර දේශපාලනවාද ඉදිරිපත් කර ඇති බවත්, ඒ සඳහා උපයෝගීකොට ගෙන තිබෙන භාෂාව සිංහලයයි කීමට නුපුළුවන. ඇතැම්හු බලයේ එල්ලී සිටින අදහසින් රටේ අභිවෘද්ධිය ගැන අබමල් රේණුවක් තරම්වත් නොතකා විවිධ ප්‍රශ්න පෙරදැරි කරගෙන දේශපාලනයට බසිති. එයින් කිසිදාක කිසිවෙකුටත් සුගතියක් ඇති නොවේ." යනුවෙනි. කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵලයක් වශයෙන් 1833 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ස්ථාපිත කිරීම මගින්, ලාංකික ජනතාවට රටේ පරිපාලන රටාවට යම් ආකාරයේ සම්බන්ධවීමක් එමගින් සිදු කිරීමට හැකි විය. ඉන්පසු වරින් වර සිදු කළ ප්‍රතිසංස්කරණ මගින් පරිපාලන රටාව වෙනසකට ලක් විය. 1910 දිවයිනේ එක් එක් ආදායම් දිස්ත්‍රික්ක මැතිවරණ කොට්ඨාසයක් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය. 1920 දී මැතිවරණ කොට්ඨාස 16 ක් වශයෙන් ද, 1931 දී ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාවට අනුව රාජ්‍ය මන්ත්‍රණ සභාව මන්ත්‍රී ආසන 58 කින් සමන්විත විය. ඉන් ආසන 50 ක් සර්වජන ඡන්ද බලයෙනුත් ඉතිරි ආසන 08 ආණ්ඩුකාරවරයා විසිනුත් පත් කළ අතර, යථෝක්ත ආසන 50 භූමි ප්‍රමාණය අනුව එනම් ජනගහණයෙන් හැත්තෑපන් දහසකට නොඅඩු ලක්ෂයක් හා එක් ලක්ෂ විසි පන්දහසක් අතර සංඛ්‍යාවක් සඳහා එක් ආසනයක් හිමිවන පරිදි ය. (පළමුවන ජනරජ ව්‍යවස්ථාවේ පළමුවන ව්‍යවස්ථා සංශෝධනය අනුව, එක් මැතිවරණ කොට්ඨාසයක් සඳහා වූ ජන සංඛ්‍යාව 75000 සිට 90000 දක්වා වැඩි කෙරුණි) 1930 රොබට් විලියම් ලයල් ග්‍රාන්ට් කොමිෂන් සභාවට අනුව මැතිවරණ කොට්ඨාස 50 ක් වශයෙන් වෙන් කෙරිණි. 1931 ජූලි රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මැතිවරණයේ දී වයස අවුරුදු 21 ට වැඩි අයට සර්ව ජන ඡන්ද බලය හිමි වීම වැදගත් සිදු වීමකි. (1959 අංක 11 දරන මැතිවරණ සංශෝධන පනත අනුව ඡන්ද ප්‍රකාශ කිරීමේ අවම වයස් සීමාව වයස අවු. 21 සිට 18 දක්වා අඩු කරන ලදී) 1946 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ රජයක් සඳහා විධිවිධාන සැලසුන අතර ආසන 89 ක් සඳහා මන්ත්‍රීවරු 95 දෙනෙකු තෝරා පත් කර ගත් අතර නම් කළ මන්ත්‍රීවරු 06 දෙනෙකු අනුව සම්පූර්ණ සංඛ්‍යාව 101 ක් විය. මෙම ව්‍යවස්ථාවට අනුව ජනගහනයේ සිදු වන වෙනස්කම්වලට අනුව පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංඛ්‍යාව වෙනස් කළ හැකි වන පරිදි සෑම ජන සංගණනයකට පසුව සීමා නිර්ණය කොමිෂන් සභාවක් පත් කිරීමට විධිවිධාන සැලසුණි. ඒ අනුව 1954 විජයවර්ධන කොමිෂන් සභා නිර්දේශ (ආසන 105 ක් දක්වා වෙනස් කිරීම) ක්‍රියාත්මක නොවුණි. 1959 තල්ගොඩපිටිය කොමිෂන් සභා වාර්තාවට අනුව මැතිවරණ කොට්ඨාස 145 ක් සහ මන්ත්‍රීවරු සංඛ්‍යාව 151 ක් වශයෙන් නිර්දේශ කෙරුණි. භූමි ප්‍රමාණ පදනම අනුව මන්ත්‍රීවරු 25 සහ ජන පදනම අනුව මන්ත්‍රීවරු 126 ක් සහ ආණ්ඩුකාරවරයා මන්ත්‍රීවරු 06 දෙනෙකු ද පත් කළ අතර සම්පූර්ණ සංඛ්‍යාව 157 ක් විය. මෙයට අනුව 1970 දක්වාම මැතිවරණ පැවැත්වුණි. 1972 ජනරජ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම අනුව ජාතික රාජ්‍ය සභාව වශයෙන් පාර්ලිමේන්තුව නාම කරණයට කෙරුණු අතර 1976 නොයෙල් තිත්තවෙල කොමිෂන් සභා වාර්තාවට අනුව, එතෙක් මැතිවරණ කොට්ඨාස 145 ක් වශයෙන් පැවති කොට්ඨාස සංඛ්‍යාව බහු ආසන 06 ක් ද සමග 160 දක්වා වැඩි කළ අතර එම ආසනවලන් මන්ත්‍රීවරු 168 දෙනෙකු පත්කර ගැනීම නිර්දේශ කරන ලදී. එකී බහු ආසන හයෙන් 04 ක් ද්වි මන්ත්‍රී කොට්ඨාස ද, 02 ක් ත්‍රි මන්ත්‍රී කොට්ඨාස ද විය.

ජනරජ ව්‍යවස්ථා සංශෝධනයට අනුව ජනගහණයෙන් සෑම අනූ දහසකටම එක් ආසනයක් සහ භූමි ප්‍රමාණයෙන් සෑම වර්ග සැතපුම් දාහක් සඳහා එක් අතිරේක මැතිවරණ කොට්ඨාසයක් වශයෙන් ආසන බෙදාවෙන් කෙරිණි. එහිදී භූමි ප්‍රමාණ පදනම අනුව මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 25 ක් ද, 1971 ජන සංගණනයට අදාළව ජනගහණය පදනම් කරගනිමින් තෝරා පත්කර ගතයුතු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 143 ක් ද විය. 1977 මැතිවරණයේ දී මෙය භාවිත විය. 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව මගින් සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දුනි. පාර්ලිමේන්තුවට පත් කර ගනු ලබන මුළු මන්ත්‍රී සංඛ්‍යාව 196 ක් වෙයි. එනම්, ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව පදනම් කර ගනිමින් මැතිවරණ කොට්ඨාස 22 අතර වාර්ෂිකව බෙදා වෙන්කර දෙනු ලබන ආසන 160 කි. එකී මන්ත්‍රී ආසන සංඛ්‍යාවෙන් 36 ක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ නිශ්චය කෙරෙන පරිදි එක් පළාතකට ආසන 04 බැගින් වන පරිදි පරිපාලන දිස්ත්‍රික් අතර බෙදා වෙන් කෙරුණි. මෙම පළාත් පදනම් කරගත් ආසන සංඛ්‍යාව මගින් භූමි පදනම් කරගත් ආසන වෙන් කිරීමේ ක්‍රමවේදය අහෝසි කෙරිණි. ඉහත පෙන්වා දුන් 196 ක් මන්ත්‍රී සංඛ්‍යාව 14 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් ජාතික පදනම අනුව මන්ත්‍රීවරු 29 ක් ද ඇතුළත්ව මුළු මන්ත්‍රී සංඛ්‍යාව 225 ක් දක්වා වර්ධනය විය. 1988 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වන සංශෝධනය අනුව මැතිවරණ කොට්ඨාස වෙන්කිරීම අනුව (05 වන සීමා නිර්ණය) මැතිවරණ

කලාප 03 ක් යටතේ මන්ත්‍රීන් 20 කට අධික සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනෙන පරිදි ක්‍රියාත්මක විය. 1988 දෙසැම්බර් හි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 15 වන සංශෝධනය අනුව, 14 වන සංශෝධනය යටතේ සිදු කළ සීමා නිර්ණය අවලංගු කෙරිණි. 15 වන සංශෝධනයෙහි ප්‍රතිඵලයක් ලෙස 1981 සීමා නිර්ණයන් නැවත ප්‍රතිෂ්ඨාපනය කරන ලදී. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් කේවල ඡන්ද ක්‍රමය අහෝසි කිරීම ත් සමග තේරී පත්වන මන්ත්‍රී සංඛ්‍යාව 196 + ජාතික පදනම අනුව 29 එකතුව 225 ක් වශයෙන් වෙයි. පාර්ලිමේන්තුව තුළ සාධාරණ නොවන කාන්තා නියොජනය මෙහිලා දැක්විය හැකි සුවිශේෂී කරුණකි.

පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පවතින රටවල් 190 ක කාන්තා නියෝජනය සලකා බැලීමේදී ශ්‍රී ලංකාවට හිමිවී තිබෙන්නේ 176 වැනි ස්ථානයයි. (2020) මෙවර පාර්ලිමේන්තු මැතිවරණයෙන් මහජන ඡන්දයෙන් මන්ත්‍රීවරීයන් 08 දෙනෙකු සහ ජාතික ලැයිස්තුවෙන් 04 දෙනෙකු පත්ව ඇත. එය ප්‍රතිශතයක් වශයෙන් සියයට 5.3 ක් පමණය. සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ 1989 පෙබරවාරි 15 මැතිවරණයේ සිට 2020 දක්වා පැවති මැතිවරණ 08 ක ප්‍රතිඵල අනුව උපරිම කාන්තා නියොජනය වී ඇත්තේ 13 ක සංඛ්‍යාවක් පමණි.

සර්වජන ඡන්දබලයට වසර අනූවක් මෙන්ම පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයට වසර හැත්තෑ තුනක ඉතිහාසයක් අපට ද ඇත. කතිරයේ බලයෙන් පත්වන නියෝජිතයින් ජනතා අභිලාෂයන් කෙරෙහි යොමු වන ආකාරය ලෝක දේශපාලනය තුළ ද විවිධ කතා බහට ලක්ව ඇති කරුණකි. සමානුපාතික ක්‍රමය තුළ පමණක් නොව පූර්ව අවදි තුළ පවා ඇතැම් දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ විවේචන පවතින බව ඉතිහාසය විශද කරයි. ජනතාවට බලය ආපසු ලබා ගත නොහැක. සමාජ ප්‍රාග්ධනය නොසළකා හැරීම කොතරම් ඛේද ජනකද, බොහෝ ක්‍රියාකාරකම් සමාජය තුළ ප්‍රකට කෘත්‍යයන් මගින් පෙන්වන දෙයට වඩා නිලින කෘත්‍යන් මගින් මනාව තහවුරු කෙරෙයි. ජාතික ධනයෙන් සැළකියයුතු කොටසක් සාවද්‍ය ලෙස භුක්ති විඳීම වැනි කරුණු පිළිබඳ ස්වයං විනයක් සමාජය තුළ ස්ථාපිතවන්නේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය තුළය.

වත්මන් ලාංකික පාර්ලිමේන්තුව මුහුණ දෙන එක් අභියෝගයක් වන්නේ, දුර්වල විපක්ෂයකට මුහුණ දීමට සිදු වීමයි. ආණ්ඩු පක්ෂයක් වඩාත් ශක්තිමත්ව කටයුතු කළ හැක්කේ විපක්ෂයක අභියෝග සමග ගැටෙමින් කටයුතු කිරීමේ දී ය. යෝජිත කටයුතු ගුණාත්මකව හා ප්‍රමාණාත්මකව විචාරයට, විවේචනයට ලක් කිරීම ශක්තිමත් විපක්ෂයක කාර්යභාරය බැවිණි. සියල්ල රටටත් ජනතාවටත් හිතෛෂී වනුයේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වීම තුළ ය.

***නිදහස් ලේඛයෙකි.**

**ආශ්‍රිත කෘති**


- සාමයෙන් යුතු ශ්‍රී ලංකාවක් සඳහා - මහාචාර්ය කාලෝ ෆොන්සේකා
- සරු දිවියට සම්භාෂණයක් - පරිවර්තනය. මහාචාර්ය, චන්ද්‍රසිරි පල්ලියගුරු
- රට බෙදන යෝජනාවලට අප විරුද්ධ විය යුත්තේ ඇයි - නීතිඥ සතිස්චන්ද්‍ර ධර්මසිරි
- ද්‍රවිඩ මුන්නේත්‍ර කසාගම් ව්‍යාපාරය හා සිංහලයාගේ අනාගතය - මහාචාර්ය තෙන්නකෝන් විමලානන්ද
- ලංකාවේ රාජාණ්ඩු යාන්ත්‍රණය - උපාලි ගුණසේකර (කිසිදු උපුටා ගැනීමක් සිදු කර නැත)
- පෙරදිග ඉතිහාසය - වී.ඩී.එස්. ගුණවර්ධන
- සර්වජන ඡන්දබලය - මැතිවරණ කොමිෂන් සභාව
- බ්‍රිතාන්‍ය ගුවන්විදුලි සේවය




පාර්ලිමේන්තු මැතිවරණයේ ඡන්ද ගණන් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් දැනුවත් කිරීමේ අවස්ථා




මැතිවරණ කාලසීමාවේ දී සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිබඳව පළාත් පාලන ආයතන නිලධාරීන් දැනුවත් කිරීමේ අවස්ථාවක්



කාඩ්බෝඩ් ඡන්ද පෙට්ටි මුද්‍රා තැබීම සහ ඡන්දය ගණන් කරන දිනය තෙක් ඡන්ද පෙට්ටි සුරක්ෂතව ගබඩා කරන අයුරු පිළිබඳවැනුවත් කිරීමේ අවස්ථා



පවත්වන ලද අදාර්ශ ඡන්ද විමසීම් අවස්ථා



# ඉහත කිසිවෙකුත් නොවේ

**ධරණී උපේකා වීරසේකර**
**සහකාර මැතිවරණ කොමසාරිස් (නීති)**

කාර්යාලයේ උස් වීදුරු කවුළුවෙන් පහත බැලූ ඇයට ගේට්ටුව ඉදිරිපිට උද්ඝෝෂණයෙහි නිරත වන ජනකාය පැහැදිලිව නෙත ගැටිණි. චණ්ඩ අයුරින් හැසිරුණු උද්ඝෝෂකයන් පාලනය කර ගැනීමට පොලිස් නිලධාරීන්ට ද මහත් පරිශ්‍රමයක් දැරීමට සිදුවිය.

ඉන්දීය පරිපාලන සේවයේ ජ්‍යෙෂ්ඨ නිලධාරිනියක වූ අර්චනා කපූර්ගේ සවනත වැකුණේ මේ මහා ඝෝෂාවයි.

"ප්‍රතාප් ! මොකද්ද මේ කලබලේ" හතිදමමින් තරප්පු පෙළ නැග ආ මහලු ලිපිකරුවා දුටු අර්චනා ඇසුවා ය.
"මිනිස්සු ඡන්ද ක්‍රමයේ වෙනසක් ඉල්ලනවා එයාලගේ නියෝජිතයෙකුට මැඩම්ව මුණ ගැහෙන්න ඕනැලු".

පළපුරුදු සිවිල් නිලධාරිනියක වූ අර්චනාට මෙවැනි විරෝධතා සහ උද්ඝෝෂණ ඉතා හුරුපුරුදුය. වෙනසක් වෙනුවෙන් අරගල කරන්නන් වෙත කුඩා කල පටන්ම ඇය ආකර්ෂණය වී සිටියාය.
"හරි ඉතින් ඉන්න, මම යන්නම් අපි එතැනට ගිහින් කතා කරමු "
"එපා එපා මැඩම් ඔය මිනිස්සු කවුද කියලා අපි දන්නේ නෑනේ මැඩම්ට අනතුරක් කරන්නත් පුළුවන්" ලිපිකරුවාගේ මුහුණින් දිස් වුයේ භීතියට පත් ලකුණු ය. එහෙත් අර්චනා කපූර්ගේ මුහුණෙන් බියක සේයාවකුදු පළ නොවීය.

ඇය සාරි පොට උරහිසට දමාගෙන අසුනින් නැගිට්ටා පමණි. මහලු ලිපිකරුවා ඇයගේ මඟ අවුරා සිට ගත්තේ ය.
"මැඩම් යන්න එපා මම එයාලගේ නායකයාව මෙතනට අඬ ගහගෙන එන්නම්"

ඔහුගේ කාරුණිකභාවයට විරුද්ධ විය නොහැකි තැන ඇය සුපුරුදු අසුනෙහි හිඳ ගත්තාය. ඇයගේ දෙනෙත් නතර වුයේ පොත් රාක්කය මත තිබූ රාධා-ක්‍රිෂ්ණා අනුරුව මතය. දෙනෙත් අඩවන් ක්‍රිෂ්ණාගේ දිගු අතැඟිලි වස්දැඬුව මතම රැඳී තිබූ අතර රාධා මහත් ස්නේහයෙන් තම පෙම්වතාගේ උර මත හිස තබා ගෙන සිටියාය. නමුත් තනිකඩව මැදි වියද පසු කරමින් සිටි අර්චනාගේ ජීවිතය තුළ "ක්‍රිෂ්ණා" කෙනෙකුට ඉඩක් නොවීය.

උද්ඝෝෂණ කණ්ඩායමේ නායකයා අර්චනාගේ කාමරයේ දොර විවර කර ගෙන ඇතුල් වුයේ ඇයගේ සිතිවිලි ධාරාව බිඳ දමමින්ය.

"මම ශංකර් මේ උද්ඝෝෂණය මෙහෙයවන්නේ අපේ පුරවැසි සංවිධානයෙන් "

ඝනකම් රැවුලකින් වැසී තිබුණු ඔහුගේ මුහුණෙන් දිස් වුයේ අපිළිවෙල පෙනුමකි. දහඩියෙන් මුළුමනින්ම තෙත්ව තිබූ කමිසයෙහි බොත්තම් දෙකක් විවරව පැවතිණි. හරිහැටි නොපීරූ ඔහුගේ හිසකෙස් තැනින් තැන රිදී පැහැයට හැරී තිබුණි. නමුත් ඔහුගේ සෘජු නාසයත් තියුණු දෙනෙත්වලත් වුයේ කොහේ හෝ දැක හුරු පුරුදු බැල්මකි.

"වාඩිවෙන්න මහත්මයා, මොනවාද සංවිධානෙ ඉල්ලීම්"
"අපි ඉල්ලන්නේ ඡන්ද අපේක්ෂකයින් කිසිම කෙනෙකුට කැමති නැතිනම් ඒක ලකුණු කරන්න ඡන්ද පත්‍රිකාවේ ඉඩක් ලබා දෙන්න කියලා"

"අහා! ශංකර් මහත්මයා ඔයා මේ ඉල්ලන්නේ නෝටා(NOTA) නැත්නම් None of the above පහසුකම නේද?"
"අන්න හරි! එතකොට අපට පුළුවන් අපි ඡන්ද අපේක්ෂකයන්ට කොච්චර අකැමතියි ද කියලා පැහැදිලිව අඟවන්න"
"ඒත් ඒකෙන් පලක් තියෙනවද? " අර්චනා පෙරළා ප්‍රශ්න කළාය.
"ඇයි නැත්තේ ! ඒකෙන් හැමෝටම වෙන්නේ යහපතක්"
"මොකක්ද ඒකෙන් පුරවැසියෙකුට තියෙන ප්‍රයෝජනේ"

"ඒක ඔබතුමියට මම සරල උදාහරණයකින් පැහැදිලි කරන්නම්. අපේ විශ්වවිද්‍යාලයේ අපි එක්ක ඉගෙන ගත්තා ලස්සන ගැහැණු ළමයෙක්. විශ්වවිද්‍යාලයේ තරුණ ශිෂ්‍යයින් කිහිප දෙනෙක්ම මේ කාලයේ දී එයාට ආදරය ප්‍රකාශ කළා. ඒත් අර ගැහැණු ළමයාගේ පිළිතුර වුණේ "ඉහත කිසිවෙකුත් නොවේ" කියන එක. ඒ නිසා එම තරුණයින් තේරුම් ගත්තා ඔවුන් කාගෙවත් ගතිගුණ හා ස්වභාවයට ඒ ගැහැණු ළමයා කැමති නැහැ කියලා, ජීවිතයේ කිසිදු බරපතලකමක් වටහා නොගෙන ජීවත් වුණු ඒ තරුණයින් දැන් තමන්ගේ ජීවිතය වෙනස් කරගෙන සාර්ථක වෙලා තියෙනවා"

"දෙයියෝ සාක්කි? ශංකර් උමාකාන්ත්! මේ ඔයාම ද?" අර්චනා සිං ගොළුව හිඳ අවසන විස්මයෙන් කටහඬ අවදි කළා ය.

"ඔව්, මම දැන් මහාචාර්ය ශංකර් උමාකාන්ත්, මේ සේරම NOTA නිසා තමයි. ඒ නිසා මේ වතාවෙවත් මගේ යෝජනාව ගැන සළකා බලන්න. රස්සාවේදීත් පරස්තාවේදීත් පසු තැවෙන්න වෙන තීරණ ගන්න එපා"

**උපදේශක මණ්ඩලය**

මහින්ද දේශප්‍රිය
ජනාධිපති නීතිඥ නලින් ජේ. අබේසේකර
මහාචාර්ය රත්නජීවන් එච්. හූල්
සමන් ශ්‍රී රත්නායක
එච්.එම්.ටී.ඩී. හේරත්
රසිකා පීරිස්

**සංස්කාරක** - චන්න පී. ද සිල්වා
**පරිගණක පිටු සැකසුම** - අමිල ගමගේ
**මුද්‍රණය** - රජයේ මුද්‍රණාලය
**ප්‍රකාශනය** - පර්යේෂණ හා සැලසුම් අංශය
මැතිවරණ කොමිෂන් සභාව

**ඔබගේ අදහස් හා යෝජනා අපට ලියන්න**

සංස්කාරක - කතිරයේ බලය
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
02, සරණ මාවත,
රාජගිරිය,
ශ්‍රී ලංකාව.

(+94)0112868441-42-43
(+94)112868426
info@elections.gov.lk
www.elections.gov.lk
SriLankaElectionCommission
elecomsl
Election Commission of Sri Lanka
Election Commission of Sri Lanka

ISSN-2706-0047
9 772706 004002



මෙම සඟරාවේ ලිපිවල සඳහන් කරුණු පිළිබඳව වගකීම ඒ ඒ ලේඛකයා සතු වන අතර, ලිපිවල ඇතුළත් කරුණුවලින් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ හෝ අදහස් ප්‍රකාශ නොවේ.